# THE WHITE HACKLE

2013 APRIL

76th issue




ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව

இலங்கை காலாட் படை சஞ்சிகை

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

www.lightinfantry.lk

# මංගල සීනු



2013 මාර්තු මස 04 වන දින කොළඹ සිනමන් ලේක් සයිඩ් හෝටලයේදී රවින්ද්‍රි අතුකෝරළ මෙනෙවිය සමග අතිනත ගත් 10 ශ්‍රීලපාහ ඒකකයේ නි/67305 කපිතාන් ඒකේඩීආර් අමරසේකර ශ්‍රීලපාහ



අප්‍රේල් මස 01 දින පස්වන උපන් දිනය සැමරූ රෙජිමුබ ශ්‍රීලපාහ සෙ/315033 කෝප්‍රල් රංජිත් එච්ජීපී ගේ ආදර පුතුණුවන් සුසිර දුෂංගන.



මැයි මස 04 දින පළමු උපන් දිනය සැමරූ 4 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/314744 සැරයන් ජයලත් එම්සී ගේ ආදර දියණිය කුසලි ඔනාය සෙන්දිනි.



අප්‍රේල් මස 03 දින හත්වන උපන් දිනය සැමරූ 26 ශ්‍රීලපාහ නි/63426 මේජර් ඊඑම්ඩබ්ලිව් බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ ගේ ආදර වැඩිමහල් පුතුණුවන් වන දම්සර චමුදි බණ්ඩාර.






මාර්තු මස 28 දින දෙවන උපන් දිනය සැමරූ 24 ශ්‍රීලපාහ ඒකකයේ නි/65334 මේජර් එන්සී මාරසිංහ ශ්‍රීලපාහ ගේ ආදර පුතුණුවන් වන බිමන් සන්දිර මාරසිංහ.



1 ශ්‍රීලපාහ සෙ/311054 වර්ණ සැරයන් දිලුක බීජීඩී (ආර්එස්පී) ගේ ආදරණිය දියණියන් මැයි මස 10 වන දින දසවන උපන් දිනය සැමරූ මුතුරංගි කෞශල්‍යා හා මැයි මස 12 වන දින පස්වන උපන් දිනය සැමරූ නිලක්ෂි කෞශල්‍යා



ජුනි මස 02 දින පළමු උපන් දිනය සැමරූ රෙජිමුබ ශ්‍රීලපාහ ඒකකයේ සෙ/316150 ඉන්දික ඊආර් ගේ ආදර පුතුණුවන් වන උදිෂ නදුන් බිම්සර.



අප්‍රේල් මස 15 දින දෙවන උපන් දිනය සැමරූ 7 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/320932 ලාන්ස් කෝප්‍රල් වසන්ත කුමාර ඩබ්ලිව්ඩී ගේ ආදර පුතුණුවන් වන දිනුක විග්මිත් මෙත්සර සේනාධීර.


# THE WHITE HACKLE

**76th Issue April 2013** www.lightinfantry.lk

Pioneer Sri Lanka Army Quarterly and the Journal of the Sri Lanka Light Infantry

# CONTENTS


| | PAGE |
|---|---|
| අදහස් උදහස් හා විවේචන | 02 |
| සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරවය දැක්වීම සඳහාය | 03 |
| රෙජිමේන්තු අධිපතිගේ සිංහල දෙමළ අලුත් අවුරුදු පණිවුඩය | 04 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 05 |
| සේවාවනිතා විත්ති | 06 - 08 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 09 - 10 |
| ක්‍රීඩා පුවත් | 11 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 12 - 14 |
| ක්‍රීඩා පුවත් | 15 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 16 - 19 |
| කෙටි කථාව | 22 - 23 |
| ලාංකික පුරා විද්‍යාත්මක උරුමය | 24 |
| කාලයේ පහර කා ඉරී නැලුනු රූ සනුව | 26 |
| ළමා ලෝකය | 26 |
| YOs' Column | 29 - 30 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 36 - 38 |
| දසුනේ හසුන | 39 |
| ප්‍රහේලිකා අංක 56 | 39 - 40 |


## කවරයේ කථාව

සූර්යයා මීන රාශියේ සිට මේෂ රාශියට සපැමිණීමේ සූර්යය මංගල්‍ය ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ මෙවරද ඉතා උත්කර්ෂවත් අයුරින් සිදු කරන්නට විය. මෙම සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවය 2013 අප්‍රේල් මස 12 දින රෙජිමේන්තු රසල් හයින් ක්‍රීඩාංගනයේදී රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් හෙළ සිරිතට අනුව පවත්වන්නට යෙදුණි. එම අවුරුදු උත්සවයේ විශේෂ දසුන් කිහිපයක් මෙවර විද්‍යමාන වේ.



10 අබාධිත අපේ හිතේ සවිය



09 නැත ඔබ තනි කළේ අප



28 රෙජිමේන්තුවේ අභිමානය

Printed by

Lettra Graphic Printers,
44/1, Negombo Road, Welisara.
Tel : 011 2234191, 0777526922
email - lettrafj@gmail.com

# THE WHITE HACKLE

SRI LANKA
LIGHT INFANTRY QUARTERLY

**Colonel of The Regiment**

Maj Gen RMD Rathnayake RWP RSP USP ndu psc

**Centre Commandant**

Brig KJ Jayaweera RSP

**The White Hackle Editorial**

**Editor in Chief**

Brig KJ Jayaweera RSP

**Assistant Editors**

Col CD Weerasooriya RSP
(Chief Of Staff - RHQ SLLI)

Maj AB Dodamwela SLLI
(ADJUTANT - RHQ SLLI)

Maj KKIA Kumara SLLI
(Officer In Charge)

**Chief Consultant**

Maj Gen RMD Rathnayake RWP RSP USP ndu psc

**Honourary Consultants**

Maj Gen HV Athukorale VSV psc FBIM
(Rtd – Reg Force)

Brig AER Abeyesinghe KSV
(Rtd – Vol Force)

**Computer Type setting & Designed**

C/SGT Gunasiri SHIUK
Pte Suranga RBP

Publisher - Regimental Centre
Sri Lanka Light Infantry

Telephone - 0112855204
0112855356 - 60

Ext - 57656

Fax - 0112855204

E-mail - editor.whitehackle@gmail.com
editor.whitehackle@yahoo.com

Website - www.lightinfantry.lk


## Feedback

### අදහස්, උදහස් හා විවේචන
### Readers Please Write in

The WHITE HACKLE the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 76th issue. This quarterly is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through 'THE WHITE HACKLE', the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write in to 'THE WHITE HACKLE' We are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is" Ich Dien"," I Serve". Let 'White Hackle' be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

-Editor-

## කතු වැකිය

රෝම අධිරාජ්‍ය කෙටි කාලයකින් ගොඩ නැඟුවක් නොවන බවත් එය පියවරෙන් පියවර ගොඩ නැඟී ස්ථාවර වූවක් බව අප සියල්ල දන්නා කරුණකි. ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවද ස්ථාවර උසස් මට්ටමකට ළඟා කරවීම සඳහා රෙජිමේන්තු අධිපති ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ශ්‍රීලපාහ සේවා වනිතා ශාඛාව වෙතින් විවිධ වූ නව ව්‍යාපෘති ආරම්භ කර ඇත. සියලු ව්‍යාපෘති රෙජිමේන්තුවේ සියලු සාමාජිකයින්ගේ අභිවෘද්ධිය සඳහා වන අතර, " උදාරයි ඔබ " වැඩ සටහන සහ නිවාස ව්‍යාපෘති යටතේ ලැබෙමින් පවතින වරප්‍රසාද මින් ප්‍රමුඛතාවයක් ගනී.

ලෝකයේ සියලුම පුද්ගලයින් තම කටයුතු සිදු කරනු ලබන්නේ හුදු ධනවත්කම රැකියාවේ දියුණුව හෝ ආත්ම සංයමය සඳහා නොව ප්‍රීතිමත්ව තම ජීවිතය ගොඩ නඟා ගැනීම සඳහා යි. ප්‍රීතිය කරා යමෙකු යන ගමනේ ප්‍රීතිය උදා කර ගැනීමේ නියම මඟ අනුන් ප්‍රීතිමත් කිරීමයි. ශ්‍රී ලංකා පාබල හමුදා හඬ වන " වයිට් හැකල් " සඟරාව තුළින් ඔබ සතු දැනුම අන් අය සමඟ බෙදා හදා ගැනීම තුළින් ඔබ ලබන සතුට ජීවිතේ සෑම පුද්ගලයෙකුටම පහසුවෙන් ලබා ගත හැකි නොවන අතර, එම ස්මරණය ඉසිඹු සුවය ලබන අවධිය තුළ පවා ඔබ සිත් තුළ රැව් පිළිරැව් දෙනු ඇත.

යුද්ධය අවසාන වී ඇති මෙවන් යුගයක බුද්ධිය මෙහෙයවා ජීවිතය සාර්ථක කර ගැනීමට අත් වැල් සපයන අප ඔබගේ නව යෝජනා සහ චෝදනා ගෞරවයෙන් සලකා බලන බවද, ඔබ වෙත කාරුණිකව දැනුම් දෙමු.


The White Hackle is published quarterly under the supervision of the Regimental Centre Commandant to educate the Sri Lanka Light Infantry Officers and men on various topics including news, information on activities, people, policies, operations, technical developments, views, opinions and ideas to satisfy their reading thirst. Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized. The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 0112855204 or 0112855356-60 Extn. 57656. Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. Publication of this periodical is authorized by the Dte, of PA Army HQ CBO by letter No. A/275/27 of 16 Mar, 94. Use of funds for printing of this Publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

## සේවයේ යෙදී සිටියදී මියගිය රණවිරුවන්ට ගෞරව දැක්වීම සඳහාය

## IN HONOUR OF THOSE SLLI HEROES WHO MADE THE SUPREME SACRIFICE

**1983** වසරේ සිට මව්බිමේ ඒකීය භාවය වෙනුවෙන් දිවි පුදු කළ ශ්‍රීලපාහ විරෝදාර රණවිරුවන් හට ගෞරව දැක්වීමක් වශයෙන් ඔවුන්ගේ නාමලේඛනය **1999** ජනවාරි කලාපයේ සිට කොටස් වශයෙන් පහත සඳහන් පරිදි පළ කරනු ලැබේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3601 | S/203071 | L/Cpl | Jayantha DM | 11 SLLI | Wishwamadu | 01/03/2009 |
| 3602 | S/208353 | L/Cpl | Fernando HDSS | 11 SLLI | Wishwamadu | 01/03/2009 |
| 3603 | S/203099 | L/Cpl | Suresh WDN | 10 SLLI | Pudukudierippu | 02/03/2009 |
| 3604 | S/271949 | L/Cpl | Kumara MUMDGC | 10 SLLI | Wishwamadu | 02/03/2009 |
| 3605 | S/207799 | L/Cpl | PereraLLPK | 11 SLLI | Pudukudierippu | 02/03/2009 |
| 3606 | S/168512 | L/Cpl | Wellawatta WM | 10 SLLI | Pudukudierippu | 03/03/2009 |
| 3607 | S/202917 | L/Cpl | Dissanayaka DMALUK | 15 SLLI | Pudukudierippu | 05/03/2009 |
| 3608 | S/321112 | L/Cpl | Nishantha KumaraVP | 10 SLLI | GH ANP | 05/03/2009 |
| 3609 | S/321617 | L/Cpl | Sumandika KKC | 11 SLLI | MH CBO | 06/03/2009 |
| 3610 | S/310109 | Cpl | Rathnayaka NC | 8 SLLI | GH CBO | 07/03/2009 |
| 3611 | S/170503 | L/Cpl | Jayasinghe DADC | 4 SLLI | Chalei | 12/03/2009 |
| 3612 | S/318912 | Pte | Ruwan KumaraHK | 4 SLLI | Chalei | 12/03/2009 |
| 3613 | S/317171 | L/Cpl | Sauja TMR | 4 SLLI | Chalei | 12/03/2009 |
| 3614 | S/321650 | L/Cpl | Madusanka JAAP | 1 SLLI | Chalei | 12/03/2009 |
| 3615 | S/319462 | L/Cpl | Jayathilaka LDN | 1 SLLI | Chalei | 12/03/2009 |
| 3616 | S/319856 | L/Cpl | Samansiri HB | 1 SLLI | Chalei | 12/03/2009 |
| 3617 | S/206344 | L/Cpl | Jeewantha MN | 1 SLLI | Chalei | 12/03/2009 |
| 3618 | S/165556 | L/Cpl | Herath LHMWK | 1 SLLI | Chalei | 12/03/2009 |
| 3619 | S/185122 | Cpl | Wewatenna WGT | 11 SLLI | GH CBO | 13/03/2009 |
| 3620 | S/210583 | L/Cpl | Suresh WM | 10 SLLI | Pudukudierippu | 15/03/2009 |
| 3621 | S/210592 | L/Cpl | Anura BandaraRK | 10 SLLI | Pudukudierippu | 15/03/2009 |
| 3622 | S/38864 | L/Cpl | Dissanayaka DMNP | 11 SLLI | Pudukudierippu | 16/03/2009 |
| 3623 | S/206356 | L/Cpl | Greru KGSK | 1 SLLI | Chalei | 16/03/2009 |
| 3624 | S/321297 | L/Cpl | Jayasuriya JMS | 1 SLLI | Chalei | 16/03/2009 |
| 3625 | S/316558 | Cpl | Sanjaya GDI | 1 SLLI | Chalei | 16/03/2009 |
| 3626 | S/43771 | L/Cpl | Sadaruwan MRD | 1 SLLI | Chalei | 16/03/2009 |
| 3627 | S/318896 | L/Cpl | Karunasiri MHC | 1 SLLI | Chalei | 17/03/2009 |
| 3628 | S/15Q01575 | L/Cpl | rathwathte RHIB | 1 SLLI | Chalei | 17/03/2009 |
| 3629 | S/307506 | Sgt | Ariyapperuma AAS | 1 SLLI | Chalei | 17/03/2009 |
| 3630 | S/310576 | S/Sgt | Idunil HMT | 11 SLLI | Pudukudierippu | 17/03/2009 |
| 3631 | S/321092 | L/Cpl | Sanjeewa MMKS | 11 SLLI | Pudukudierippu | 17/03/2009 |
| 3632 | S/196924 | L/Cpl | WijebandaraRM | 11 SLLI | Pudukudierippu | 17/03/2009 |
| 3633 | S/177058 | Sgt | Darmasiri HDRS | 11 SLLI | Pudukudierippu | 17/03/2009 |
| 3634 | S/320483 | L/Cpl | Kumaratunga TGS | 11 SLLI | Pudukudierippu | 17/03/2009 |
| 3635 | S/320841 | L/Cpl | Wasantha TGRM | 11 SLLI | Pudukudierippu | 17/03/2009 |
| 3636 | S/210801 | L/Cpl | Udith KumaraHTN | 11 SLLI | Pudukudierippu | 17/03/2009 |
| 3637 | S/202133 | L/Cpl | Jayantha JA | 11 SLLI | Pudukudierippu | 17/03/2009 |
| 3638 | S/319948 | L/Cpl | BandaraDWI | 11 SLLI | Pudukudierippu | 17/03/2009 |
| 3639 | S/194528 | L/Cpl | PushpakumaraWMS | 11 SLLI | Pudukudierippu | 17/03/2009 |
| 3640 | S/321168 | L/Cpl | Abekirthi RMI | 20 SLLI | Pudukudierippu | 18/03/2009 |
| 3641 | S/208419 | L/Cpl | Dissanayaka DMS | 20 SLLI | Pudukudierippu | 18/03/2009 |
| 3642 | S/302242 | L/Cpl | Peiris NPNL | 20 SLLI | Pudukudierippu | 18/03/2009 |
| 3643 | S/43664 | L/Cpl | Abesinghe AMTK | 20 SLLI | Pudukudierippu | 18/03/2009 |
| 3644 | S/315310 | Cpl | Chandrapala MGD | 11 SLLI | Victory HOS | 18/03/2009 |
| 3645 | S/202117 | L/Cpl | Niroshan Krush WT | 11 SLLI | Pudukudierippu | 18/03/2009 |
| 3646 | S/23Q01111 | L/Cpl | Adikari AMIP | 20 SLLI | Pudukudierippu | 19/03/2009 |
| 3647 | S/305001 | S/Sgt | Senavirathna BKGR | 1 SLLI | G:H: Cbo | 19/03/2009 |
| 3648 | S/321114 | L/Cpl | Jayamal UMP | 10 SLLI | G:H: ANP | 19/03/2009 |
| 3649 | S/23Q00316 | L/Cpl | Piyathilaka KGS | 20 SLLI | Pudukudierippu | 19/03/2009 |
| 3650 | S/2D03465 | L/Cpl | Wijerathna EAGG | 20 SLLI | Pudukudierippu | 19/03/2009 |

තව කොටසක් ලබන කලාපයේ

# රෙජිමේන්තු අධිපති

## මේජර් ජෙනරල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයු පීඑස්සී
## විසින් නිකුත් කරනු ලබන
## 2013 වර්ෂයේ සිංහල සහ හින්දු අලුත් අවුරුදු පණිවුඩය

සූර්යයා මීන රාශියෙන් මේස රාශියට සංක්‍රමණය වීමත් සමඟ උදාවන 2013 සිංහල සහ දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති වශයෙන් සුබාශිංසන පණිවුඩයක් නිකුත් කරනුයේ ඉමහත් සතුටිණි.

වසර 30ට අධික කාලයක් පැවති කුරිරු යුද්ධය නිමාකර මව්බිමට සාමය උදාකරදීම සඳහා යුද්ධ හමුදාව විසින් දක්වනු ලැබූ සුවිශේෂී දායකත්වයෙහි පෙර ගමන් කරුවා ලෙස අභිමානවත් කාර්යය භාරක් ඉටු කරන ලද පාබල හමුදා සාමාජිකයින් වන අප සැම රට දූවැන්ත සංවර්ධනයක් උදෙසා පියනගන මෙම මොහොතේ ද එහි පෙරගමන් කරුවෙකු ලෙස උදාවෙන්නා වූ නව වසර සමරනු ලබන්නේ මහත් ආඩම්බරයෙණි.

සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද අපගේ සශ්‍රීකත්වයේ මංගල්‍යයයි. යුද්ධ හමුදා සම්ප්‍රදායන් සමස්ත ජන සමාජයන්ට ආදර්ශයක් වන අයුරින් අඛණ්ඩව පවත්වාගෙන යාමට පාබල හමුදාව සැම විටම ක්‍රියාකර ඇති අතර, දේශිය අනන්‍යතාවය රැකෙන අයුරින් චිරාත් කාලයක සිට පැවත එන හෙළ සිරිත් විරිත් මතු පරපුර වෙත දායාද කිරීමට පාබල සාමාජිකයන් වන අපගේ පූර්ණ වගකීමක් බැව් මා මෙම අවස්ථාවේදී පෙන්වා දෙන අතර, එහි සුවිශේෂී සංධිස්ථානයක් ලෙස 2013 සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද සැමරීම පෙන්වා දිය හැක.

අප මාතෘභූමිය ආසියාවේ ආශ්චර්ය කරා රැගෙන යාමට රටේ ප්‍රධාන පුරවැසියාගේ සිට සමස්ත ශ්‍රීලාංකික ජනතාව කැපවී ක්‍රියා කරන මෙවන් අවස්ථාවක ජාතීන් අතර සංහිදියාව ඇති කිරීමේ මහඟු අවස්ථාව විශේෂයෙන් උතුරු නැගෙනහිරි ප්‍රදේශයන්හි රාජකාරි කරනු ලබන අපගේ පාබල සාමාජිකයින් හට මෙම අවුරුදු උදාව සුවිශේෂී අවස්ථාවක් බැව් මාගේ හැඟීමයි. එසේ හෙයින් ප්‍රදේශයේ දමිළ ජනතාව හැකි සැම අයුරකින්ම සම්බන්ධ කරගෙන දේශීය අනන්‍යතාවය රැකගනිමින් චිරාත් කාලයක සිට පවත්වාගෙන එන සම්ප්‍රදායන් හට ප්‍රමුඛත්වය දෙමින් රටේ සමස්ත ජනතාවට අදර්ශයක් වන අයුරින් මෙම අවස්ථාව සැමරීමට අප විසින් වග බලා ගත යුතුය.

පාබල සෙබළුන් වන අප ඥාතීන් සමග එක්ව නව අවුරුදු උදාව සැමරීමට නොහැකි වූ අතර, පසුගිය වසර කිහිපයක් තුළ අප බොහෝ දෙනෙකුට සිය නෑ හිත මිතුරන් සමඟ ඉතා සතුටින් අවුරුදු සැමරීමට හැකිවීම අප ලැබූ භාග්‍යක් ලෙස සලකන්නෙමි. එහෙත් දේශීය භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් ප්‍රාණ දානයෙන් දායක වූ 4500 ආසන්න අපගේ පාබල විරුවන්ගේ ඥාතීන් හා හිත මිතුරන්, තම පුතණුවන්, තම සහෘද්ධයාණන්, තම පියාණන් හා තම කළණ මිතුරා නොමැතිව මෙම අවුරුදු උදාව සමරනු අප මේ අවස්ථාවේදී අමතක නොකළ යුතුය. අප සියලු දෙනා හට මෙම අවුරුදු උදාව ඔවුන් සමඟ එක්ව සැමරීමට නොහැකි නමුත්, මාගේ සුවිශේෂී අවුරුදු සුබාශිංසන සමස්ත පාබල හමුදාව වෙනුවෙන් මා මෙම අවස්ථාවේ දී ඔවුන් වෙත කෘතවේදිත්වයෙන් යුතුව පිළිගන්වන්නෙමි. තවද කාය දානයෙන් දායකත්වය ලබාදී මේ වන විට පූර්ණ ආබාධිත තත්ත්වයට පත්ව තම ඥාතීන්, හිතමිතුරන් හා එක්වීමට නොහැකිව නිවසින් බැහැරව ගත කරන අපගේ රණවිරුවන්ට ද, ඔවුන්ගේ ඥාතීන් හා හිතමිතුරන්ට ද, සුබාශිංසන එක් කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නෙමි.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා පාබල හමුදාවේ සියලුම නිලධාරීන්, සෙසුනිලයින් ඇතුලු ඔවුන්ගේ පවුල්වල සියලුම සාමාජිකයන්ටත්, සිවිල් සේවක මහතුන් ඇතුලු එම පවුල්වල සියලුම සාමාජිකයින්ටත් ලැබුවා වූ මේ සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද යස ඉසුරින් සපිරි සෞභාග්‍යමත් සුබ අලුත් අවුරුද්දක් වේවා

ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පීආර්එස්පී යූඑස්පී
මේජර් ජෙනරල්
රෙජිමේන්තු අධිපති ශ්‍රී ලංකා පාබල හමුදාව

2013 අප්‍රේල් මස 14 දින





2013.02.27 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ මූල්‍ය පරිත්‍යාගයෙන් යුද හමුදා මූලස්ථාන සේවාවනිතා ශාඛාවේ උපදෙස් පරිදි මුල්ලේරියා මානසික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් වෙත දිවා ආහාර සහ සබන්, දත් බෙහෙත්, පවුඩර් යනාදිය අඩංගු ත්‍යාග පාර්සල් පරිත්‍යාග කරන ලදී.

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව වෙතින් පහත නම සඳහන් රණවිරුවන් දෙදෙනාගේ දරුවන් වෙත ශිෂ්‍යාධාර මුදල් ගරු සභාපතිනි දමයන්ති රත්නායක මැතිනියගේ දුරතින් පරිත්‍යාග කිරීමක් 2013.03.10 දින දී සිදු කරන ලදී

**සෙ/303972 වර්ණ සැරයන් ප්‍රනාන්දු ජීඑස්**
**ජීඑස් නෙතුසහන් ප්‍රනාන්දු (පුතා)**
**සෙ/12966 සාසෙ දයානන්ද ඩී**
**ඩීඑච් භයානුක වසුන්දර (පුතා)**





## සේවා වනිතා චිත්ති

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව වෙතින් රෙජිමේන්තු ශිල්පාගාර ඒකකයේ ආබාධිත රණවිරුවකු වන සෙ/322037 ලාංකෝ රත්නායක ඊඑච්කේ ගේ අසනීප තත්ත්වයෙන් පසුවන ආදරණීය මවට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා 2013.03.10 දින ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ දමයන්ති රත්නායක ගරු සභාපතිනි ගේ දුරතින් රුපියල් 50,000.00 ක මුදලක් පරිත්‍යාග කරන ලදී.





# සේවා වනිතා විත්ති

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි දමයන්ති රත්නායක මැතිනිය හා සෙසු සාමාජිකාවන්ගේ සහභාගිත්වයෙන් සුබසාධක කටයුතු සඳහා අරමුදල් සපයා ගැනිමට පවත්වාගෙන යනු ලබන ගැලන්ට් බේකරි ආයතනයේ රාජකාරි කරනු ලබන අයවලුන් වෙත 2013.04.08 දින අලුත් අවුරුදු ත්‍යාග පරිත්‍යාග කළහ.







ලෝක කාන්තා දිනයට සමගාමීව ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව 2013.03.10 දින රණවිරුවන්ගේ භාර්යාවන් වෙනුවෙන් රූපලාවන්‍ය වැඩමුළුවක් පැවැත් වූ අතර, එම වැඩමුළුව නේචර් සීක්‍රට් (පුද්) සමාගමේ රූපලාවන්‍ය උපදේශිකාවක් විසින් මෙහෙය විය.





ශ්‍රී ලංකා යුද හමුදා සේවාවනිතා ශාඛාව වෙතින් සංවිධානය කරන ලද ''රණ අරුණ උදාන - 2013'' අවුරුදු පොළ තුළ පාබල හමුදා සේවානිතා ශාඛාව වෙතින් පවත්වාගෙන ගිය වෙළඳ කුටිවල අලෙවි කිරීම සඳහා කැබිතිගොල්ලෑව සිවිල් ආරක්‍ෂක බල ප්‍රදේශයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් වයිඑම් පුංචිබණ්ඩා ශ්‍රීලපාහ විසින් කැබිතිගොල්ලෑව ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ගොවිපලවල් තුළින් ලබාගන්නා ලද කුළුබඩු විශාල ප්‍රමාණයක් 2013.03.26 වන දින පරිත්‍යාග කළේය. එමෙන්ම ශ්‍රී ලංකා පාබල හමුදා පුහුණු පාසල බූස්ස හි ප්‍රධාන පුහුණු උපදේශක මේජර් ඒඑම්එම් ගුණසේකර ශ්‍රීලපාහ ගේ හා අනෙකුත් නිලධාරින්ගේ සම්බන්ධීකරණයෙන් ගාල්ල ප්‍රදේශයේ දානපතියන් විසින් කුළු බඩු හා ඇඟළුම් ආශ්‍රිත විශාල භාණ්ඩ ප්‍රමාණයක් 2013.04.08 දින පරිත්‍යාල කරන ලදී.





# සම්බුදු තෙමගුල සැමරූ ශ්‍රීලපාහ සේවාවනිතාවන්



## බෝධි පූජා පිංකම්

වෙසක් පෝය නිමිති කර ගෙන සේවයේ යෙදී සිටින හා ආබාධිත රණවිරුවන්ට සෙත් ප්‍රාර්ථනා කිරීමත්, මියගිය රණවිරුවන්ට නිවන් සුව ප්‍රාර්ථනා කිරීමත් අරමුණු කරගෙන ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව වෙතින් ධර්ම දේශනාවක් 2013.05.20 දින පවත් වන ලදී. මෙම අවස්ථාව සඳහා රෙජිමේන්තු අධිපති හා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි දමයන්ති රත්නායක මැතිනිය සහභාගි වූහ.

## මඤ්ඤොක්කා දන්සල

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව වෙතින් 2013.05.24 දින සම්බුදු තෙමගුල නිමිත්තෙන් මඤ්ඤොක්කා දන්සලක සංවිධානය කරන ලදී. පනාගොඩ බෝධිරුක්ඛාරාම පන්සල අසල බැතිමතුන් උදෙසා පවත් වන ලද මෙම දන්සල හී කටයුතු සොයා බැලීම සඳහා රෙජිමේන්තු අධිපති හා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි දමයන්ති රත්නායක මැතිනිය සහභාගි විය.







## රණ අරුණ අවුරුදු උදානය - 2013

ශ්‍රී ලංකා යුද හමුදාවේ රණවිරුවන්ගේ සුබසාධන කටයුතු සඳහ අරමුදල් සපයා ගැනීමේ අරමුණින් හා උදාවූ සිංහල හින්දූ අවුරුදූ උත්සවය සඳහා සහනදායි මිළට භාණ්ඩ ලබාදීමේ අරමුණු කරගෙන ශ්‍රී ලංකා යුද හමුදා සේවා වනිතා ශාඛාව මඟින් සංවිධානය කළ රණ අරුණ උදාන- 2013 ඉතා උත්කර්ෂවත් අයුරින් 2013.04.09 හා 10 දෙදින තුළ පනාගොඩ යුද හමුදා පාසැල් ක්‍රීඩාංගනයේ දී පැවැත් වූහ. මෙම අවුරුදූ පොළ සඳහා ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාව වෙතින් රෙදිපිළි වර්ග හා කුළු බඩු වර්ග මෙන්ම පාබල හමුදා රණවිරු නිපයුම් වලින් සමන් විත අලංකාර වෙළඳ කුටි 06 ක් මඟින් භාණ්ඩ ඉතා සහන මිලට ලබාදීමට කටයුතු කරන ලදී.

මෙම අවුරුදූ පොළ සාර්ථක කර ගැනිම සඳහා සේවා වනිතා ශ්‍රීලපාහ ශාඛාවට භාණ්ඩ ලබාදෙමින් හා ශ්‍රම ශක්තියෙන් දායක වූ සියලු දෙනාගේ කැපවීමෙන් ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යාමට හැකි විය. එමෙන්ම ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට අයත් ජ්‍යෙෂ්ඨ නිලධාරින් සියළුම දෙනාටමත්, ඒකක අණදෙන නිළධාරින් සියළුම දෙනාටමත් ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගෞරවනීය ස්තූතිය හදපිරි සතුටින් පුද කරමු.









# 8 ශ්‍රීලපාහ පුවත්

## 9 වන සංවත්සරය



8 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ස්ථාපනය කර වසර නවයක් සපිරීම නිමිත්තෙන් 2013.03.25 දින 0915 පැයට ඒකක අණදෙන නිලධාරි හට සම්මාන මුරයක් පිරිනැමීම සිදු කළේය. අනතුරුව අණදෙන නිලධාරි විසින් කඳවුරු භූමියේ අඹ පැලයක් රෝපණය කර පසුව භටපිරිස් අමතන ලදී. 1215 පැයට සියලු නිලයන් නියෝජනය වන පරිදි දිවා භෝජන සංග්‍රහයක් සතුටින් භුක්ති විඳින්නට විය.

එදින සන්ධ්‍යා භාගයේදී සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට කටයුතු සිදුකළ අතර, 142 වන බලසේනාධිපතිගේ ප්‍රධානත්වයෙන් සාදය ආරම්භ විය.

සංගීත ප්‍රසංගය ආරම්භ කිරීමට පෙර රට දැය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහිකිරීමෙන් පසු 4 ශ්‍රීලපාහ ඒකකයේ අධිරිද්ම සංගීත කණ්ඩායම හා 12 ශ්‍රීලපාහ ඒකකයේ අධිරිද්ම සංගීත කණ්ඩායමේ තත් වලට හෝමාගම රේන්බෝ නර්තන කණ්ඩායම විසින් නර්තනයෙන් දායකත්වය ලබාදුන්හ. සංගීත ප්‍රසංගය පැවැත්වෙන අතරතුරෙහිදි 9 වන බළඇණි සංවත්සරයේදී කණ්ඩායම් අතර සුහදත්වය හා එකමුතුභාවය වර්ධනය කරගැනීම සඳහා පැවැත්වූ ක්‍රිකට් හා වොලිබෝල් තරගාවලියේ ජයග්‍රාහකයින්හට කුසලාන හා සහතිකපත් පිරිනැමීම සිදු කළහ. මීට අමතරව ඒකක 9 වන සංවත්සරයේ දී බලලත් නිලධාරි සහ සැරයන් නිවස්නයේ ද සුහද හමුවක් පැවැත්වීමට කටයුතු කළහ.

2013.03.26 දිනට යෙදී තිබූ මැදින් පුර පසළොස්වක පොහොය දින රටට සාමය උදාකිරීම වෙනුවෙන් ජීවිත පූජාකළ රණවිරුවන් හට පිංපතා හා තුවාල ලැබූවන් හට ඉක්මන් සුවය පතමින්ද දැනට සක්‍රිය සේවයේ යෙදී සිටින අයවලුන් හට තෙරුවන් සරණ පතා 1730 පැයට බෝධිපූජා පිංකමක්



පැවැත් වූහ. එමෙන්ම කොරතොට ප්‍රදේශයේ පිහිටි විල්බට් පෙරේරා බියුෆඩ් සමරනායක අනුස්මරණ වැඩිහිටි නිවාසය වෙත දහවල් දානය පිරිනැමීමට හා එදින වැඩිහිටියන් හට ඇප



උපස්ථාන කිරීමට සැළසුම් කළහ. ඒ අනුව ප්‍රථමයෙන් වැඩිහිටි නිවාසය ඇතුළත හා අවට ප්‍රදේශය පිරිසිදු කිරීමට ක්‍රියාකළ අතර, පසුව වැඩිහිටියන්ගේ කොණ්ඩා රැවුල් හා නියපොතු කපා ඔවුන් නහවා පිරිසිදු කිරීමට කටයුතු කළහ. ඉන්පසු වැඩිහිටි නිවාසයෙහි ඇති බුදු මැදුර වෙත ගොස් සියල්ලෝම බුදුන් වැඳ ආගමික වතාවත් සිදු කර අනතුරුව දහවල් දානය පිනැමීම සිදු කළහ. ගිලන්ව සිටි වැඩිහිටියන් හට කවාපොවා සත්කාර සිදු කිරීම තමන්ගේ මව්පියන්ට සළකන ලෙසින් සොබළුන් විසින් කළහ. ඒකක කැලිප්සෝ සංගීත කණ්ඩායම විසින් සුමියුරු සංගීත රාවය මුදුකළ අතර, වැඩිහිටියන්හට එය අලුත් අත් දැකීමක් විය.

ඉන් අනතුරුව වැඩිහිටි නිවාසය වෙත අත්‍යාවශ්‍යව තිබූ රෙදි සෝදන යන්ත්‍රයක්ද ඒකකයේ නිලධාරින් හා සෙසුනිලයිනගේ ධන පරිත්‍යාගයෙන් ඒකක අණදෙන නිලධාරි විසින් වැඩිහිටි නිවාසය වෙත පරිත්‍යාග කරන ලදී.

ඉදිරියේදීද මෙවන් වූ සත්ක්‍රියාවන් සිදු කිරීමට තව තවත් ශක්තිය හා ධෛර්යය අණදෙන නිලධාරි ඇතුලු සියලුම දෙනාට හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරන අතර, මෙම කාර්යයට සහභාගි වූ සැමටත් සහයෝගය දැක්වූ සැමටත් නිදුක් නිරෝගි සුවය ලැබේවායි ප්‍රාර්ථනය කරන්නෙමු.

**බුද්ධි අංශය 8 ශ්‍රීලපාහ**



# 8 ශ්‍රීලපාහ පුවත්

## සූර්ය මංගලය

සැම පුද්ගලයින් හට යහ මග වැටහේවා
සැම හදවත් තුළින් දුසිරිත් දුරුවේවා
යහපත් සිතුවිලිම හදවතේ ඉපදේවා
බක් මහ උදාවෙන් සැමදේ ඉටුවේවා

කරදර නිමාවී ජයමග අත්වේවා
සැම තිවසක්ම කිරි පැණියෙන් ඉතිරේවා
සැම යහපත් සිතවිල්ලක්ම එලෙසම ඉටුවේවා
සිංහල අවුරුද්දේ අප දිවියම සරුවේවා



2013 වර්ෂයේ සූර්යයා මීන රාශියේ සිට මේෂ රාශියට සංක්‍රමණය වීමේ ඓතිහාසික මංගල්‍ය බක් මස 14 වන ඉරිදා පූර්වභාග 0129ට ආරම්භ වීමත් සමඟ අත් අවුරුදු උදාව සිදුවන්නට විය. පසුව පූර්ව භාග 04.06ට යෙදුණු සුබ මොහොතින් ලිප ගිණි මොලවා සැමට සාමය සතුට සෞභාග්‍ය උදාවේවා යන උදාරතර චේතනාවෙන් බළඇණි මූලස්ථානය තුළ කිරි උතුරුවා අනෙකුත් සම්ප්‍රදායික පිළිවෙත් නොපිරිහෙලා ඉටු කළ අතර, උදාවූ අත් අවුරුද්දේ ඒකක අණදෙන නිලධාරි හා නිලධාරින්ගේ සෙබළුන්ගේ ඒකායන ප්‍රාර්ථනය අප මෙසේ සටහන් තබන්නෙමු.




අප ඒකකය වෙත පැවරි ඇති රාජකාරි ස්වාභාවය මත ඒකක හටපිරිස් එක් රැස් කර ගනිමින් බක් මහ උලෙළක් පැවැත්වීමට නොහැකි වුවද අවුරුදු උදාවෙන් පසු පූර්වභාග 07.05 යෙදී තිබූ සුබ මොහොතින් ඒකක අණදෙන නිලධාරිගේ ප්‍රධානත්වයෙන් යුතුව චාරිත්‍රානුකූලව විරාගත පොල්තෙල් පහන දල්වමින් තේපැන් සංග්‍රහයක් පැවත්වන්නට යෙදුණි. මෙහිදී අණදෙන නිලධාරි සියලු දෙනා හට සුබ පැතූ අතර ඒකකය සමගින් රාජකාරි කරනු ලබන සිවිල් සේවක මහතුන් හට ත්‍යාග ප්‍රධානය කිරීම සිදු කරන්නට යෙදුණි. පසුව සිවිල් සේවක මහතුන් වෙනුවෙන් සාදයක් පැවැත්වීමටද කටයුතු සිදු කිරීමට අමතක නොකළෙමු. නායකත්ව ගුණාංග ඉස්මතු කරමින් ක්‍රියාවෙන් අදර්ශය පෙන්වා දෙමින් ඒකක අණදෙන නිලධාරි සමඟ අවුරුදු අසිරිය ඒකකය තුළ විදගත් බැව් සඳහන් කරනුයේ ඉතා නිහතමානීත්වයෙන් හා එතුමන්ගේ ගුණවත් භාවයට ගරුබුහුමන් දක්වමිණි.

## සාමසාධක රාජකාරි නිමාවෙන් ඒකකයට පරිත්‍යාගයක්

16 වන එක්සත් ජාතින්ගේ සාමසාධක බළඇණිය වෙත සහභාගීවූ 8 ශ්‍රීලපාහ ඒකකයේ නිලධාරින් හා සෙබුනිලයින් විසින් රුපියල් 30567.00 ක මුදලක් වැයකර ඒකකයේ අඩුපාඩුවක්ව පැවති ත්‍රිත්ව ක්‍රියාකාරීත්වයෙන් යුත් මුද්‍රණ යන්ත්‍රයක් 2013.05.05 වන දින ඒකකයේ ප්‍රයෝජනය සඳහා අණදෙන නිලධාරි වෙත පරිත්‍යාග කරන ලදී.




බුද්ධි අංශය 8 ශ්‍රීලපාහ



# ක්‍රීඩා පුවත්



## වෙරළබඩ කඹ තරඟාවලිය - 2013

ශ්‍රී ලංකා යුද හමුදා සන්නද්ධ බුද්ධි බලකාය හා බෙන්තොට බීච් ෆෙස්ට් ක්‍රීඩා සමාජය එක්ව දෙවන වතාවට සංවිධානය කරන ලද ''බෙන්තොට බීච් ෆෙස්ට්'' වෙරළබඩ ක්‍රීඩා තරඟාවලිය 2013 මාර්තු මස 22 සහ 23 යන දිනයන්හිදී බෙන්තොට සංචාරක වෙරළ තීරයේදී අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

මෙම තරඟාවලිය දෙස් විදෙස් ක්‍රීඩක/ක්‍රීඩිකාවන්ට විවෘත තරඟාවලියක් වූ අතර, මේ සඳහා වොලිබෝල්, පාපන්දු, කබඩි, පිහිනුම්, කඹ ඇදීම, රුවල්ඔරු, යන ක්‍රීඩා ඉසව් රාශියක් පවත්වන ලදී. සියලුම ඉසව් නියෝජනය කරමින් දක්ෂ ක්‍රීඩා කණ්ඩායම් හා ක්‍රීඩා සමාජ සහභාගි වූ අතර, කඹ ඇදීමේ ඉසව්ව නියෝජනය කරමින් ශ්‍රීලපාහ රෙජිමේන්තු කඹ කණ්ඩායම සහභාගි වන ලදී.

උක්ත තරඟාවලිය සඳහා කණ්ඩායම් විශාල ප්‍රමාණයක් සහභාගි වූ අතර, 'ඒ' සහ 'බී' වශයෙන් කාණ්ඩ දෙකක් යටතේ පිළිමලුන් පිටු දැකීමේ ක්‍රමයට තරඟ වදින ලදී. ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායම 'ඒ' කාණ්ඩය යටතේ තරඟ වැදුණි. 'ඒ' කාණ්ඩයේ සියලු තරඟවලින් ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායම අවසන් තරඟය සඳහා සුදුසුකම් ලැබූ අතර, 'බී' කාණ්ඩයේ අවසන් තරඟය සඳහා සුදුසුකම් ලැබුවේ ශ්‍රී ලංකා ගුවන් හමුදා කණ්ඩායමයි.

තරඟාවලියේ සමාප්ති උළෙල සඳහා ආරාධිත අමුත්තන් වශයෙන් පැමිණියේ ශ්‍රී ලංකා සන්නද්ධ බුද්ධි බලකා රෙජිමේන්තු අධිපති හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, මැති ඇමතිවරු සහ අති විශාල ප්‍රේක්ෂක ජනතාවක් සහභාගි විය. ඔවුන් ඉදිරියේ තරඟාවලියේ අවසන් දිනයේ අවසන් ඉසව්ව වශයෙන් කඹ ඇදීමේ ඉසව්ව පැවැත්වුණි. ශ්‍රී ලංකා ගුවන් හමුදා කණ්ඩායම පරාජයට පත් කරමින් ශ්‍රීලපාහ රෙජිමේන්තු කඹ කණ්ඩායම 2013 වසරේ දෙවන වරට පැවැත් වූ වෙරළබඩ ක්‍රීඩා තරඟාවලියේ කඹ ඇදීමේ ඉසව්වේ ශූරතාවය දෙවන වතාවටත් දිනා ගැනීමට සමත්විය.

මෙම ජයග්‍රහණය ශ්‍රීලපාහ රෙජිමේන්තුවට පමණක් නොව සමස්ත යුද හමුදාවටම ආඩම්බරයක් මෙන්ම ගෞරවයකි. ශ්‍රීලපාහ කඹ ඇදීමේ කණ්ඩායම වෙත රෙජිමේන්තු අධිපති ඇතුලු සියලුම නිලයින්ගේ උනුසුම් සුබ පැතුම් එක් කරන්නෙමු.

**ක්‍රීඩා අංශය - රෙම ශ්‍රීලපාහ**

# 26 ශ්‍රීලපාහ පුවත්

## 26 ශ්‍රීලපාහ නව නියමුවාණන්



රුදුරු ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම සඳහා මානුෂීය මෙහෙයුමේ සිටින රණවිරුවන්ට සහය ලබාදීම වස් 2008 දෙසැම්බර් මස 18 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය වන්නි යටතේ ස්ථාපිත දෙවන ආධාරක බළඇණිය ලෙසින් මෙම ඒකකය බිහිවිය. පසුව ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ ළාබාලතම සාමාජිකයා ලෙස 2010 පෙබරවාරි මස 17 දින 26 වන බළඇණිය ශ්‍රීලංකා පාබල හමුදාව වූ මෙහි ප්‍රථම අණදෙන නිලධාරි ලෙසින් නි/61834 ලුතිනන් කර්නල් ජේඑල්ටීකේ හේවා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ රාජකාරී කරන ලදී. 26 ශ්‍රීලපාහ ඒකකයේ තම සේවා කාලය නිම කර එහි නායකත්වය නි/62607 මේජර් ජීඒඩීකේජී ගනේගොඩ පීඑස්සී ශ්‍රීලපාහ වෙත 2013.02.08 භාරදෙන ලදී.

මේජර් ජීඒඩීකේජී ගනේගොඩ පීඑස්සී ශ්‍රීලපාහ යනු ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ඉතා විශාල සේවාවක් සිදු කළ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වන අතර, 7 ශ්‍රීලපාහ ඒකකය සමඟින් කිලිනොච්චි ප්‍රදේශයේ රාජකාරී කරන කාල සීමාවේදී එල්ටීටීඊ ත්‍රස්තවාදීන් භීතියට ලක් කළ අවස්ථා අපමණය. විශාල පීඩනයක් එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට ලබාදී ඉදිරි ආරක්ෂක වළල්ලේ ආරක්ෂාව තරවුරු කරමින් ඉතා දක්ෂ ලෙස ක්‍රියාන්විත රාජකාර කළහ. රුදුරු ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරයන්ට ලක්වී බරපතල ලෙස තුවාල ලැබූ මෙම වීර සෙන්පති සුවය ලබා තම නායකත්වය 26 ශ්‍රීලපාහ ඒකකය වෙත ලබාදීමට කැප වී ඇත. නව නියමුවාණනි ඔබ හට මෙම ඒකකය ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ පමණක් නොව ශ්‍රී ලංකා යුද හමුදාවේ ද දිදුලන ඒකකයක් කිරීමට ඇවසි ශක්තිය ධෛර්යය නොඅඩුව ලැබේවායි අප සැම ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය - 26 ශ්‍රීලපාහ**

# 10 ශ්‍රීලපාහ පුවත්

## 19 වන බළඇණි සංවත්සරය



ශ්‍රීලපාහ රෙජිමේන්තුව තුළ දීප්තිමත් බළඇණියක් වශයෙන් පෙරට පැමිණි 10 ශ්‍රීලපාහ ඒකකය තම 19 වැනි උපන්දිනය උත්කර්ෂවත් අන්දමින් සමරන්නට විය. එදා මෙදා තුර නායකත්වය ලබාදුන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 9 දෙනෙකුගේ අණදීම යටතේ මහත් කැපවීමෙන් හා දැඩි අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කර ඇති මෙම ඒකකය දසවන අණදෙන නිලධාරී මේජර් කේඩීඑල්සී විජේනායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ අණදීම යටතේ මුලතිව් දිස්ත්‍රික්කයේ මල්ලාවි ප්‍රදේශයේ ස්ථානගතව තම රාජකාරීන් ඉටු කරනු ලබයි. වසර 30 කට අධික කාලයක් මව්බිම වෙළාගෙන සිටි රුදුරු ත්‍රස්තවාදය පරදවා සාමයේ අරුණළු මතින් ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් උත්සවශ්‍රීයෙන් බළඇණි දිනය සැමරීමට ලැබීම මහත් වූ භාග්‍යකි. 2013.01.02 දින ඒකකයේ නිලධාරී හා සෙනින්ගේ සහභාගීත්වයෙන් මහනුවර ඓතිහාසික ශ්‍රී දළදා මාළිගාවේදී ශ්‍රී දළදා වහන්සේ වෙනුවෙන් ගිලන්පස පූජාවක් පවත්වා එදා මෙදා තුර ඒකකය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන්ට නිවන්සුව ප්‍රාර්ථනා කරමින් හා තුවාල ලබා ප්‍රතිකාර ලබමින් සිටින රණවිරුවන්ට නිරෝගි ඉක්මන් සුවය ද, සේවයේ යෙදී සිටින අයවළුන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ටත්, සිවිල් සේවක මහතුන්ටත් සෙත් ප්‍රාර්ථනා කරන ලදී.

ඉනික්බිතිව 2013.01.06 දින රුවන්වැලි මහසෑය අභියස මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ගේ සහභාගීත්වයෙන් සියළු නිලයින්ට සෙත් ප්‍රාර්ථනය කර තෙවන වරටත් කප්රුක් පූජාවක් පවත්වන්නට යෙදුණි. පසුව අණදෙන නිලධාරී විසින් රණවිරුවන්ගේ ළඟම ඥාතීන් මුණගැසී ඔවුන්හට පැන නැගී ඇති ගැටළු පිළිබඳ සුහද සාකච්ඡාවක් පවත්වා පැන නැගී ඇති ගැටලු සඳහා විසඳුම් ලබා දුන්හ. 2013.01.14 දින යෙදී තිබූ තෛපොංගල් දිනය නිමිති කරගෙන බළඇණියට සෙත් පතා වව්නිකුලම් ප්‍රදේශයේ පිහිටි ශිවම් කෝවිලේදී දේව පූජාවක් පවත්වන ලදී. ඒකකයේ භටපිරිස් සහභාගීත්වයෙන් ශිවම් කෝවිල සුද්ද පවිත්‍ර කිරීමද එදිනම සිදු කළහ. 2013.01.19 දින මල්ලාවි මූලික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් වෙත උදා තේ පානය සහ දිවා ආහාරය ලබා දෙමින් සෙනින්ගේ ශ්‍රම දායකත්වයෙන් මල්ලාවි රෝහල සම්පූර්ණයෙන්ම සුද්ද පවිත්‍ර කළහ. එදින 10 ශ්‍රීලපාහ මූලස්ථානයේදී මතුගම ශ්‍රී අභයරාජාරාමයේ නාරලවිල සමිත හිමියන් වඩම්මවා බෝධිපූජාවක් පවත්වන ලදී. 2013.01.21 දින ඒකක බළලත් නිලධාරී සහ සැරයන් නිවස්නයේ සුහද සාදයක් පවත්වන ලදී. 2013.01.23 වන දිනට යෙදුන බළඇණි දිනය නිමිති කරගෙන ඒකකයේ අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයක් පිරිනමන ලදී. අණදෙන නිලධාරී විසින් භූමියේ අඹ පැලයක් රෝපණය කිරීමෙන් පසු සියළු නිලයින් ඇමතූහ. ඉන්පසු ඒකකයේ මෙතෙක් අඩුපාඩුවක්ව පැවති සෙසුනිලයින් සඳහා භටනිවාසය භටපිරිස්ගේ ශ්‍රම දායකත්වයෙන් හා ප්‍රාදේශියව සොයාගත් සම්පත් උපයෝගි කර ගනිමින් අඩි 20 X 100 කින් යුතුව ඉදිකරන ලද භටනිවාසය සෙසුනිල ප්‍රයෝජනය සඳහා එළඹි සුබ මොහොතින් පවරා දුන්හ. පසුව සියළු නිලයින්ගේ දිවා භෝජන සංග්‍රහයක් පැවැත් වූහ.

එදින සන්ධ්‍යාවේ රෙම ශ්‍රීලපාහ අධි රිද්ම සංගීත කණ්ඩායමේ තත්සර මධ්‍යයේ නිලධාරී නිවස්නයේ සුහද හමුවක් පවත්වන ලදී.

19 වන සංවත්සර දිනට සමගාමීව ඒකකයේ රාජකාරියේ නියුතු සෙසුනිලයින් හා සිවිල් සේවක මහතුන්ගේ එකමුතුකම



හා සුහදශීලිත්වය ගොඩනැගීම අරමුණ කර ගනිමින් 2013.01.25 වන දින කමාන්ඩෝ රෙජිමේන්තුවේ අධිරිද්ම සංගීත කණ්ඩායම සහභාගි කරවාගෙන සංගීත ප්‍රසංගයක් හා සුහද සාදයක් පවත්වන ලදී.

10 ශ්‍රීලපාහ ඒකකය තම 19 වන සංවත්රය සමරන මේ මොහොතේ අතීතයේ සිට විවිධ වූ දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් යුද්ධ හමුදාවේ දීප්තිමත් බළඇණියක් වශයෙන් පෙරට එමට හැකිවූයේ ඒකකයට අණදීම සිදුකළ සියලුම අණදෙන නිලධාරීන්ගේ නිවැරදි මග පෙන්වීමත් ඒකකය සමගි රාජකාරි ඉටු කළ සියලුම නිලධාරී හා සෙසුනිලයින්ගේ ඉමහත් කැපවීම හා නොපසුබට උත්සහයත් නිසාවෙන් බැව් මේ සුවිශේෂී අවස්ථාවේ සනිටුහන් කරනුයේ ඉතාමත් ගෞරවයෙණි.

**බුද්ධි අංශය - 10 ශ්‍රීලපාහ**





# 24 ශ්‍රීලපාහ පුවත්

## නව අණදෙන නිළධාරි



වර්ෂ 2009 ක් වූ සැප්තැම්බර් මස 25 වන දින රෙම ශ්‍රීලපාහ හිදි මේ ලක්දරණියතලය මත ස්ථාපනය කෙරුනු 24 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ ප්‍රථම අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි කළ නි/62153 ලුතිතන් කර්නල් කේඑම්ඩබ්ලිව් බණ්ඩාර ආර්එස්පී ශ්‍රීලපාහ කොනොනිපුපා කළාඹයහි අණදෙන නිලධාරි තනතුර සඳහා රපෝර්තු කිරීමෙන් පසු නව අණදෙන නිලධාරි වශයෙන් නි/63030 මේජර් එස්එම්එන්ඒබී අරඹෙපොල ශ්‍රීලපාහ 2012.12.11 වන දින යෙදී තිබූ සුබ මොහොතින් මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනා මධ්‍යයේ රාජකාරි භාරගන්නා ලදී. මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ වසර 19 ක කාලය තුළ ලද අත්දැකීම් සහ පරිනත භාවය හදාරණ ලද දේශිය විදේශිය පාඨමාලාවන් හි ලත් දැනුම තුළින් මෙම බළඇණිය ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ සහ යුද්ධ හමුදාවේ දිදුලන බළඇණියක් වනු ඇතැයි ඒකකයේ සියළුදෙනා විශ්වාස කරන්නෙමු. නව අණදෙන නිලධාරි තුමණි ඔබගේ සැලසුම් සියල්ල සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි බළඇණියේ සියලුම නිලධාරින් හා සෙසුනිලයින්ගේ ඒකායන ප්‍රාර්ථනයයි.

## ශිෂ්‍යත්ව හපනුන්ට අත්වැලක්

24 ශ්‍රීලපාහ ඒකකය 213 බළසේනා මුලස්ථාන බළප්‍රදේශයේ සෙට්ටිකුලම් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරි වසම් 21ක ජීවත්වන සිංහල දමිළ මුස්ලිම් වැසියන්ගේ සුබ සාධක කටයුතු පිළිබඳව සොයා බලනු ලබයි.

මෙම ඒකක අණදෙන නිලධාරි මේජර් එස්එන්එම්ඒබී අරඹෙපොල ශ්‍රීලපාහ ගේ උපදෙස් මත නිලධාරි අණදෙන වරුන්ගේ සහයෝගයෙන් යුතුව 213 බළසේනා මුලස්ථානය සමඟින් සත් කාර්යයක් සිදු කිරීමට පෙළ සැදුණි. ප්‍රදේශයේ ජීවත්වන අඩු ආදායම් ලබන පවුල්වල 2012 වර්ෂයේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූ හා වැඩිම ලකුණු ලබාගත් දූ දරුවන් 25 දෙනකු සඳහා ඒකකය හා ප්‍රදේශයේ ධානපතියන්ගේ ආධාර උපකාර ඇතිව රුපියල් 300,000.00 කට අධික මුදලක් වැයකර 2013.02.27 වන දින වාරිකුට්ටූර් ගනේශ්වරම් විදුහලේදී පාසල් බෑග්, පාසල් පොත් සහ විවිධ පාසල් උපකරණ බෙදා දෙන ලදී. තවද ශිෂ්‍යත්ව හපනුන් සඳහා අපොස සාපෙළ දක්වා මාසිකව පාසල් උපකරණ මිළදී ගැනීම සඳහා ශිෂ්‍යත්ව ආධාර ලබාදීමට කටයුතු යොදා ඇත.



මෙම මහඟු අවස්ථාව සඳහා ප්‍රධාන අරාධිත අමුත්තන් වශයෙන් ආසේමු (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් එම්එච්එස්බී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, 21 සේනාංකාධිපති සහ 213 බළසේනාධිපති ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරින්ද ප්‍රදේශයේ ප්‍රභූ පිරිස් සහ විවිධ ජාතින්ට අයත් ප්‍රදේශවාසින් ද විශාල සංඛ්‍යාවක් සහභාගි වන ලදී.

**බුද්ධි අංශය - 24 ශ්‍රීලපාහ**





# 10 ශ්‍රීලපාහ පුවත්

## වසරක පියසටහන්

10 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව 2012.03.24 දින සිට 2013.03.24 දින දක්වා අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි කරනු ලබන නි/62545 මේජර් කේඩීඑල්සී විජේනායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ නායකත්වයෙන් යටතේ වසරක පිය සටහන් මෙසේ සටහන් තබන්නෙමු.

2012.04.02 දින බලඇණියේ සාමූහික පුහුණුවීම් සඳහා බලඇණි පුහුණු පාසල මුලංකාවිල් වෙතින් ඉතාමත් උසස් ලෙස ප්‍රතිඵල ලබා ගනිමින් සාමූහික පුහුණුවීම් අවසන් කිරීමට හැකිවිය.

දීර්ඝ කාලීනව සිට බලඇණිය ක්‍රියාන්විත රාජකාරියේ නියැලී සිටීම හේතුවෙන් භටපිරිස් හි ප්‍රයෝජනය සඳහා තාවකාලික ගොඩනැගිලි ඉදිකර තිබූ අතර. එම තාවකාලික ගොඩනැගිලි වෙනුවට නව ගොඩනැගිලි ප්‍රාදේශිය වශයෙන් අමුද්‍රව්‍ය සපයාගෙන ඉදි කරන ලදී.

- 100 X 20 ක භට නිවාසයක් ඉදිකිරීම
- පෙරතිම් ගොඩනැගිලි දෙකක් ඉදිකිරීම
- පානිය ජල අවශ්‍යතාවය හා ස්නානය සඳහා ළිදක් ඉදිකර ජලනල පද්ධතියක් මඟින් ජලය බෙදා හැරීම
- බළලත් නිලධාරි සහ සැරයන් නිවස්න නේවාසිකාගාරය ඉදිකිරීම
- නිලධාරි නිවස්න නේවාසිකාගාරය ඉදිකිරීම
- බලඇණි ආයුධාගාරය ඉදිකිරීම
- ක්‍රියාන්විත මැදිරිය ඉදිකිරීම

ඒකකය ආසේමු(කිළි) යටතේ 65 සේනාංකයට අනුයුක්තව 653 බලසේනාව යටතේ රාජකාරි කරනු ලබන අතර, ඒකකය ස්ථානගත බලප්‍රදේශය තුළ විධිමත් ලෙස සිවිල් පරිපාලනය ස්ථාපිත වී ඇත. ඒ අනුව බලප්‍රදේශය තුළ පදිංචි දමිළ ජනතාව හා යුද්ධ හමුදාව අතර, කිසිදු ගැටළු සහගත තත්ත්වයක් ඇති නොවන පරිදි ඔවුන් සමඟින් අන්‍යෝන්‍ය සුහදත්වයක් ඇති කරගෙන ඔවුන්ගේ ජන ජීවිතය නංවාලීම සඳහා සහ අනාගත අභිවෘද්ධිය උදෙසා සුවිශාල මෙහෙවරක් ඉටුකර ඇති ඇත. බලප්‍රදේශය තුළ සිටින රාජ්‍ය සේවකයින් හා ප්‍රදේශයේ ප්‍රභූවරුන් සමඟින් පවතින පොදු ගැටළු හා ඒවාට ගතහැකි විසඳුම් පිළිබඳව සාකච්ඡා කර ඒවා එම අවස්ථාවේදීම ඉහළ මූලස්ථාන වෙත ඉදිරිපත් කර විසඳුම් ලබාගැනීමට කටයුතු කිරීමෙන් දිනෙන් දින සිවිල් ජනයා හමුදාව කෙරෙහි ඔවුන්ගේ විශ්වාස තව තවත් වැඩි වී ඇත.

කාන්තා සෙබළිය වෙත නිවස ප්‍රධානය කිරීමෙන් පසු





ප්‍රදේශයේ ජන ජීවිත ගොඩනැගීමට දිරි දෙමින්

- 2013.01.19 දින මල්ලාවි රෝහල පිරිසිදුකර එහි සිටින නේවාසික රෝගීන් හා කාර්යය මණ්ඩලය වෙත තේ පැන් සංග්‍රහයක් හා දිවා ආහාරය පිරිනැමීම.
- පුන් පොහෝ දිනයන් නිමිතිකොටගෙන ඒකකය ස්ථාපිත බලප්‍රදේශයේ පදිංචි සිවිල් ජනතාව වෙනුවෙන් දන්සැල් පැවැත්වීම.
- මංකිනගර් ප්‍රදේශයේ පදිංචි දිළිඳු පවුලක් වෙත ඒකක භටපිරිස් හි ශ්‍රම දායකත්වයෙන් ප්‍රාදේශිය වශයෙන් සපයා ගන්නා ලද අමුද්‍රව්‍ය උපයෝගි කර ගනිමින් නිවසක් ඉදිකර දීම.
- යුද්ධ හමුදාව වෙත බඳවා ගන්නා ලද වේලුරාජේශ්වරි කාන්තා සෙබළිය වෙත ඒකක භටපිරිස්හි ශ්‍රම දායකත්වයෙන් අංග සම්පූර්ණ නිවසක් ඉතා කෙටි කාලයක් තුළ ඉදිකර දීම.

10 ශ්‍රීලපාහ ඒකකය මෙසේ වසරක කාල සීමාවක් තුළදී සිදු කළ සේවාවන් තුළදී ඒකකයේ අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලධාරින් මෙන්ම රෙජිමේන්තු සැරයන් මේජර් හා සෙසුනිලයින්ගේ කැපවීම තුළින් ලබාගත් ජයග්‍රහනයන් බැව් අභිමානයෙන් යුතුව සනිටුහන් කරන්නෙමු. ඉදිරියේදීද මෙවන් කාර්යයන් සිදු කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි අප ඉත සිතින් ප්‍රාර්ථනය කරන්නෙමු.

**බුද්ධි අංශය - 10 ශ්‍රීලපාහ**



නිලධාරී නිවස්නයේ නව නේවාසිකාගාරය විවෘත කරමින්



# ක්‍රීඩා පුවත්

## අන්තර් රෙජිමේන්තු ස්වෙච්ඡා වොලිබෝල් තරඟාවලිය - 2013

ශ්‍රී ලංකා යුද හමුදා ස්වෙච්ඡා බලසේනා මූලස්ථානය මගින් සංවිධානය කරනු ලැබූ අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරඟාවලිය 2013 මාර්තු මස 19 දින සිට 23 දින දක්වා අඹේපුස්ස සිංහ රෙජිමේන්තු ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පවත්වන ලදී.

මෙම තරඟාවලිය සඳහා ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායම ඉදිරිපත් වූ අතර, ශ්‍රීලපාහ කණ්ඩායම තරඟ කිරීමට සිදු වූයේ දක්ෂතම කණ්ඩායම් 6 යටතේය. අපගේ ප්‍රතිවාදී කණ්ඩායම් ලෙසින් ශ්‍රීලංජාආබමු, ශ්‍රීලකාහ, ශ්‍රීලංඉසේබ, ශ්‍රීලංයුපොදුසේබ, ශ්‍රීලංයුසේබ, යන රෙජිමේන්තු කණ්ඩායම් විය. මෙම තරඟාවලිය ලීග් ක්‍රමය යටතේ පැවැත්වුණි. මූලික වට තරඟවලින් ලද ජයග්‍රහණ මත අවසන් මහා තරඟ සඳහා කණ්ඩායම් තෝරා ගන්නා ලදී. ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායම දැක්වූ විශේෂ දක්ෂතාවයෙන් මූලික වටයේ සියලුම තරඟ ජයග්‍රහන කර අවසන් තරඟාවලිය සඳහා සුදුසුකම් ලබා ගන්නා ලදී.



අවසන් තරඟය සඳහා ගිය වසරේ ශූරතාවය හිමි කරගත් ශ්‍රීලයුසේබ කණ්ඩායම හා ශ්‍රීලපාහ කණ්ඩායම සුදුසුකම් ලැබූහ. ස්වෙච්ඡා බලසේනා මූලස්ථානයේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීඑල්පී වික්‍රමසිංහ ආර්එස්පී කේඑස්වී ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය. එම අවස්ථාවට ශ්‍රීලංජාආබමු රෙජිමේන්තු අධිපති බ්‍රිගේඩියර් එම්එම් කුලතුංග ඇතුලු ජ්‍යෂ්ඨ නිලධාරීන් හා විශාල දිරිගන්වන්නන් පිරිසක් ඉදිරියේ පැවැති මෙම තරඟ ඉතාමත් තියුණු මුහුණුවරක් ගැනිණ. ශ්‍රීලයුසේබ රෙජිමේන්තු කණ්ඩායම තමන්ගේ උපරිම ජවය හා ශක්තිය යොදා තරඟ වැදුනත් ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායම දැක්වූ සුවිශේෂී දක්ෂතාවයන් ඉදිරියේ ඔවුන් පැවති වට තුනම පරාජයට පත්විය. ස්වෙච්ඡා බලසේනා අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරඟ ඉතිහාසයේ ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායමක් ලද අති විශිෂ්ටම ජයග්‍රහණය මෙය වන අතර, මෙවර තරඟාවලියේ ශ්‍රීලපාහ කණ්ඩායමේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි කුසලානය සෙ/2012වීඑෆ්ආර්ඩී73207 සාසෙ සාමකුමාර කේඑම්එස් ද, දක්ෂතම පන්දු සකසන්නා ලෙසින් සෙ/2012වීඑෆ්ආර්ඩී72580 සාසෙ මාරසිංහ එම්ඒඩීඑම් ද, දක්ෂතම ප්‍රහාරකයා ලෙස සෙ/2012වීඑෆ්ආර්ඩී70532 සාසෙ දයාරත්න එම්ඒඑස්ජී යන ක්‍රීඩකයන් සමත් වූහ.

මෙම ජයග්‍රහනය ලබාගැනීමට මහත් කැපවීමක් දිරිගැන්වීමක් ලබාදුන් රෙජිමේන්තු සේනාවිධායක බ්‍රිගේඩියර් කේජේ ජයවීර ආර්එස්පී, ක්‍රීඩා භාර නිලධාරී, රෙජිමේන්තුවේ අනිකුත් ජ්‍යෂ්ඨ නිලධාරීන් කණ්ඩායමේ පුහුණුකරු උප පුහුණුකරු ප්‍රවීණ ක්‍රීඩකයින්ය හට අපගේ කෘතවේදීත්වය මෙසේ පළ කරන අතරම මෙවන් ජයග්‍රහන ඉදිරියේදී ද ලබාගෙන ශ්‍රීලපාහ රෙජිමේන්තුව වර්ණවත් කිරීමට හැකිවේවායි අපි සැම ප්‍රාර්ථනා කරන්නෙමු.

**ක්‍රීඩා අංශය - රෙම ශ්‍රීලපාහ**








# 4 ශ්‍රීලපාහ පුවත්

## කෙප්පිලව් නිවාස 50 ක් ජනතා අයිතියට

රට තුළ දශක තුනකට අධික කාලයක් පැවැති කුරිරු ත්‍රස්තවාදය නිමාවෙන් පසු අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ මහගු කාර්යය යුද හමුදාව මැදිහත් වී සිදු කරන අතර, එහි අවසන් අධියර මැණික්පාම් කඳවුරේ හා ආනන්ද කුමාරස්වාමි කඳවුරේ සිටි අවතැන් වූවන් 2012.09.25 දින පවුල් 165 ක් කෙප්පිලව් ආදර්ශ ගම්මානයේ නැවත පදිංචි කිරීම සිදු කරන ලදී. පවුල් 50 ක් වෙනුවෙන් ස්ථිර නිවාස හා වැසිකිළි ඉදි කරදීමේ පළමු අධියර සඳහා මුල්ගල් තැබීම 2012.11.02 දින නැවත පදිංචි කිරීමේ අමාත්‍ය ගරු ගුණරත්න වීරකෝන් මැතිතුමා අතින් සිදු කරන ලදී.

ආසේමූ(මු) ආඥාපති මේජර් ජෙනරාල් එල්බීආර් මාර්ක් ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ හා 59 සේනාංකාධිපති බ්‍රිගේඩියර් එම්කේඩී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ 592 බලසේනාධිපති බ්‍රිගේඩියර් එස්ඒආර් සමරසිංහ ආර්එස්පී යූඑස්පී ගේ මඟ පෙන්වීම මත 4 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරි මේජර් ජීඩීජේසී ප්‍රේමතිලක පීඑස්සී ශ්‍රීලපාහ ගේ උපරිම දායකත්වයෙන් නිවාස ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන ලදී. මේ සඳහා 59 සේනාංකයට අයත් සියලුම ඒකක වෙතින් ශ්‍රම දායකත්වය ලබාදුන් අතර, ඉදි කිරීම් කටයුතු සඳහා මෙම ඒකකය වෙතින් හටපිරිස් ශ්‍රම දායකත්වය ලබාදෙන ලදී.

මාස 03 කට ආසන්න කාලයක් ඉතා කැපවීමෙන් අරමුණ මුදුන්පත් කරගැනීම සඳහා කටයුතු කළ හටපිරිස් කෙප්පිලව් ආදර්ශ ගම්මානයේ නිවාස ව්‍යාපෘතියේ පළමු අදියර සාදා නිමකරන ලදී. නිවාස 50 ක් ජනතා අයිතියට පත්කිරීම සහ දෙවන අදියරේ නිවාස 115 සඳහා මුල්ගල් තැබීමේ උත්සවය 2013.03.16 දින කෙප්පිලව් ආදර්ශ ගම්මානයේදී උත්සවාකාරයෙන් පවත්වන ලදී. ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අමාත්‍ය ගරු ගුණරත්න වීරකෝන් මැතිතුමා සහභාගි විය. එම අවස්ථාවට මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති, මුලතිව් දිසාපති ඇතුලු සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගිත්වයෙන් මෙම කර්තව්‍ය සිදු කරන ලදී. යුද හමුදාව විසින් කරන ලද මෙම සත්කාර්යය පැමිණ සිටි සියලු නිලධාරීන්ගේ මහත් පැසසුමට ලක්විය.

**බුද්ධි අංශය - 4 ශ්‍රීලපාහ**







# ප්‍රියාවිය මගේ

කලක සිට බැඳුනු පෙම මා ඔබ ගැන
යහළුවන් සමග ඔබ යන විට පන්තියට
ඉඟි බිඟි පා සෙනෙහසින් සිනාසී ගියේ
මගේ හදවතේ රැඳුනේ ඔබ පමණයි ප්‍රියාවියේ
නොසිතූ ලෙස බැඳුනි මා යුද හමුදාවට
යුද පිටියේ දී නොසිතූ ලෙස
මගේ දෙනෙත් අහිමි විය
රුදුරු බිම් වෙඩිය මා අන්ධ කළේ මන්ද
මා කළ පාපය කුමාක් ද මා නොදනිමි

මට අද ඔබේ රුව දක ගන්නට බැරිය
ඔබ අද වෙනෙකෙකුගේ අතගෙන ගියේ ඇයි ද?
මගේ දෑස් අන්ධ වූවාට මගේ සිතේ ඇති
ඔබට බැඳී ආදරයත් අන්ද කළේ ඇයි ප්‍රියේ
මා ඔබට කිසිදින වෛර නොකරමි ප්‍රියේ
මන්ද යත් මා ඔබට තවම ළෙංගතුය
ඔබ අන්සතු වුවත් මා අන්සතු නැත
ඔබ වෙනුවෙන් මා
හුදෙකලාවෙන් සැමදා සිටිමි ප්‍රියේ

2/ලුතිතන් එච්ආර්එන් සංජීව ශ්‍රීලපාහ - 4 ශ්‍රීලපාහ

# ශ්‍රීලපාහ රෙජිමේන්තුව බබලවන තරු

## විදෙස් පාඨමාලවෙන් දස්කම් දැක් වූ 24 ශ්‍රීලපාහ නිලධාරි

ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශයේ පාබල පුහුණු මධ්‍යස්ථානයේදී තරුණ නිලධාරි පාඨමාලා අංක 29 පැවැත් වූ අතර, එම පාඨමාලාව සඳහා 24 ශ්‍රීලපාහ ඒකකයේ නි/65334 මේජර් එන්සී මාරසිංහ ශ්‍රීලපාහ ද රෙජිමේන්තුව මෙන්ම ශ්‍රී ලංකා යුද හමුදාව නියෝජනය කරමින් සහභාගි විය.



2012 දෙසැම්බර් මස 02 සිට 2013 අප්‍රේල් මස 22 දින දක්වා විවිධ රටවල් වලින් පැමිණි නිලධාරීන් 35 දෙනෙක් හා ඉන්දීය හමුදා නිලධාරීන් 293 සමගින් පැවැත් වූ මෙම පාඨමාලාව ඉතා දක්ෂ ලෙස හදාරා ව්‍යාපෘති වාර්තාව හිමි නෙවන ස්ථානය හිමිකර ගැනීමට මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි සමත් වී ඇත. ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවටත්, ශ්‍රී ලංකා යුද හමුදාවටට මෙන්ම ශ්‍රී ලංකා මාතාවට හිමිකර දුන් මෙම ජයග්‍රහනයට රෙජිමේන්තු අධිපති තුමා ඇතුලු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම් මේජර් එන්සී මාරසිංහ ශ්‍රීලපාහ වෙත මෙසේ එක්කරන්නෙමු.


# 11 ශ්‍රීලපාහ පුවත්

## ඒකකයට පරිත්‍යාගයක්



16 වන එක්සත් ජාතින්ගේ සාම සාධක බළඇණිය වෙත 11 ශ්‍රීලපාහ ඒකකය වෙතින් සහභාගි වු නිලධාරි සහ සෙබුනිලයින් විසින් ඒකකයේ සයිනි 11 සංගිත කණ්ඩායමේ ප්‍රයෝජනය සඳහා රුපියල් 108,640.00 ක් වටිනා ශබ්ද විස්තාරකයක් (Ampifiler) 2013.05.14 වන දින 1010 පැයට යෙදුන සුබ මොහොතින් ඒකක අණදෙන නිලධාරි වෙත පරිත්‍යාග කළ අවස්ථාව කාවයේ සනිටුහන් වූ අයුරු.

## කෙළිබිම ජයගත් ශ්‍රීලපාහ වීරුවෙක්



2013 මාර්තු මස 30 වන දින 39 වන ජාතික ක්‍රීඩා උළලේ කොළඹ දිස්ත්‍රික් කායවර්ධන තරඟ වොරින්ටන්හි දී පැවැත්විණි. එම තරඟයන් සඳහා කිලෝ ග්‍රෑම් 60 බර පන්තිය සඳහා මෙම ඒකකයට අයත් සෙ/313174 කෝප්‍රල් ඉන්ද්‍රජිත් එම්එල් සහභාගි වී අනිකුත් ක්‍රීඩකයන් රැසක් අතුරින් දෙවන ස්ථානය දිනා ගන්නා ලදී. ශ්‍රීලපාහ රෙජිමේන්තුවෙන් 4 ශ්‍රීලපාහ ඒකකයෙන් නාමය බබලවන්නට තම දස්කම් පා ඉදිරියට යන මෙම ක්‍රීඩකයා හට අප සැම සුබ පතන්නෙමු.

**බුද්ධි අංශය - 4 ශ්‍රීලපාහ**


# 11 ශ්‍රීලපාහ පුවත්






## සිංහල දෙමළ අලුත් අවුරුදු උත්සවය

කොවුල් නාදය දස දෙසින් ඇදීමත් සමඟ සිංහල දමිළ අලුත් අවුරුද්ද අසිරිය ශ්‍රීලංකාද්වීපය වෙළගනු ලබයි. යාපනය ප්‍රදේශයේ දෙමළ ජනතාව සමඟ 2013 සිංහල හින්දු අලුත් අවුරුද්ද සැමරීමට දුක සතුට බෙදාහදා ගැනීමට 11 ශ්‍රීලපාහ ඒකකයට හැකි විය.



කුරිරු යුද්ධය නැමති භයානක වචනය දෙමළ ජනතාව අතුරින් තුරන් කිරීමට ආසේමු(යා) ආඥාපතිගේ පූර්ණ සංකල්පයක් මත 51 සේනාංකාධිපතිගේ හා 513 බළසේනාධිපතිගේ මඟ පෙන්වීමෙන් ඒකක අණදෙන නිලධාරි නි/62252 ලුතිතන් කර්නල් ජේකේආර්පී ජයසිංහ අර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ හා නි/63485 මේජර් එම්ටීඅයි ගුණවර්ධන ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ අය නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඒකක නිලධාරින් මෙන්ම සෙසුනිලයින් සිවිල් වැසියන් සමග සම්බන්ධතාවයෙන් අලුත් අවුරුදු උත්සවයක් 2013.04.21 වන දින යාපනය වඩ්ඩු හිංදු විද්‍යාලයේදී නෙස්ටමොල්ට් සමාගමේ පූර්ණ දායකත්වය ඇතිව දිනය පුරා පවත්වන ලදී.

පාපැදි, කොට්ටාපොරය, අලියාට ඇස තැබීම, අන්ධයාට කිරි කැවීම, හා කඹ ඇදීමේ තරඟ ඇතුලු තරඟ විශාල සංඛ්‍යාවක් පවත් වන ලදී. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් 51 සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඩීඑම්ඩීසී ගුණවර්ධන සහභාගි විය. එම අවස්ථාවට 513 බළසේනාධිපති, කරෙයිනගර් ප්‍රාදේශිය ලේකම්තුමිය, චංකානි ප්‍රාදේශිය ලේකම්තුමා සහළාගි වූහ. පැවති සියලුම තරඟ සඳහා වටිනා ත්‍යාග ලබාදී දෙමළ ජනතාව හා යුද්ධ හමුදාව සමඟියෙන් යාපනය ප්‍රදේශයේ අලුත් අවුරුදු උත්සවය ඉතා උසස් අයුරින් සමරන ලදී. මේ අයුරින්ම එළඹෙන වර්ෂ වලද මෙවැනි උත්සව ඉතා විශිෂ්ඨ ලෙසින් පැවැත්වීමට මෙන්ම සමඟිදාමය තව තවත් ශක්තිමත් කර ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.



**බුද්ධි අංශය - 11 ශ්‍රීලපාහ**

# 4 ශ්‍රීලපාහ පුවත්




## මුල්ලියාවේලි බක්මහ උළෙල



මුල්ලියාවේලි ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් 2013 සිංහල දමිළ අලුත් අවුරුද්ද වෙනුවෙන් 592 බලසේනාධිපතිගේ මග පෙන්වීම මත 4 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරි මේජර් ජීඩීජේසී ප්‍රේමතිලක පීඑස්සී ශ්‍රීලපාහ හා 20 (සෙව්) ගැහේබ අණදෙන නිලධාරි ගේ අධීක්ෂණය යටතේ 2013.04.24 දින මුලතිව් විද්‍යානන්ද විද්‍යාලයේදී බක්මහ උළෙලක් පවත්වන ලදී. ඉතා උත්කර්ෂවත් ලෙස සංවිධානය කර තිබූ අවුරුදු උත්සවයේ සඳහා ප්‍රධාන ආරාදිත අමුත්තා වශයෙන් ආසේමු (මු) ආඥාපති මේජර් ජෙනරාල් එල්බීආර් මාර්ක් ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ සහභාගි විය.

මෙම අවුරුදු උත්සවය සාර්ථක කර ගැනීම සඳහා මුල්ලියාවේලි වෙළඳ සංගමය යුද හමුදාව සමඟ මනා සහයෝගයකින් උත්සව කටයුතු සංවිධානය සඳහා එක්වූ වූහ. මෙතෙක් නොවූ විරූ විශාල ජනකායක් අවුරුදු උළෙල සඳහා සහභාගී වීම කැපී පෙනෙන සිදුවීමක් ද, විය. මෙම බක්මහ උළෙල හුදෙක් උත්සවයකට පමණක් සීමා නොවී යුද හමුදා උතුරු නැගෙනහිර ප්‍රදේශයෙන් ඉවත් කිරීමට කටයුතු කරන විවිධ පාර්ශව වලට සිවිල් ජනතාව කොතරම් යුද හමුදාව සමඟ අත්වැලි බැඳගෙන කටයුතු කිරීමට කැමති දැයි පසක් කරන මහා ආදර්ශයක් වූ බව සඳහන් කරනුයේ නිහතමානිවයි. ආරාධිත අමුත්තාගේ ප්‍රධානත්වයෙන් එදින සන්ධ්‍යාවේ ජයග්‍රාහකයින් හට ත්‍යාග ප්‍රදානය කිරීමෙන් පසු බක්මහ උළෙල නිමාව සනිටුහන් වන ලදී.

**බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ**














# රෙම ශ්‍රී
# සිංහල
# අලුත් අ
# අසිරිය ස
# සනිටුහන













# කෙටි කථාව

## ම්ලාන වූ කුසුමක්

අහස හරිම කළුවරයි. එකම තරු කැටයක් වත් පායා නැත. ඇඟ කිළිපොලා යන සීතල සුළඟ දසතින් හමා යයි. තව සුළු මොහොතකින් අනෝරා මහ වැසි ඇද හැලෙන පෙර නිමිති පෙන්නුම් කරනු ඇත. රාත්‍රී තැපැල් දුම්රිය මර හඬ දීගෙන බදුල්ල බලා දිව යයි. රේල් පාරට ඉහළින් ඇති කනත්තේ ස්ථිර වාසස්ථාන කරගත් ඇතැම් තැනැත්තන්ගේ පවුල්වල මහ එවුන් කසිප්පු වෙරි හිදෙන තුරු ගොර හඬ දෙන හඬ ඇතින් ඇසේ. ඊයේ මිහිදන් කළ කනත්තේ මල් වඩම් සුළඟට පෙරළි පෙරළී මල් ගැලවී දස අතේ ගොසිනි. තමන් නිවස් සුව පතා ගැසූ බැනර් හෙට දින ජරා ජීර්ණ වනු ඇත. රණවිරුවන් උන්ගේ වීර හඬින් මුළු පළාතම දෙවනක් කරමින් මගේ පැල්පත අභියස ගිගුරුවේ ය. දෙයියන්ට බුදුන්ට දල්වූ පහනේ පොල් තෙල් හමාර වී පහන නිවී ගොස් ය.

සඳමාලි මගෙන් සදහටම නීතියෙන් වෙන් වීමට ඉදිරිපත් කර තිබූ දික් කසාද නඩුව පෙනී සිටීමට මම උදෙන්ම මහනුවර උසාවියට ගියෙමි. ඇය මගෙන් අපේක්ෂා කළ සෑම දෙයක්ම මට හැකි උපරිමයෙන් ලබා දුන්නා සේම ඇගේ මේ ඉල්ලීමද ඉටු කර දීම මගේ යුතුකමක් යැයි මට හැඟේ උසාවියේදී ඇය මට මුහුණු නොදුන්නේ මා දකීමට ඇයට ඇති අවමානයද කියා ස්ථිරවම මම වටහාගත නොමැත. එහෙත්, ඇගේ දෑස් අග කඳුළු කැට නලියන අයුරු ස්ථිරවම මම දුටුවෙමි.

මගේ පැල්පතේදී ඇය විඳි දුක් ගැහැට නිසා හෙළූ කඳුළු හා මේ කඳුළු කැටත් අතර මහා ලොකු වෙනසක් මට නොපෙනේ. මේ සෑම කඳුළු කැටයක්ම වටකුරු බව පමණක් සිතට දුනේ. එදා උසාවියේ නඩුකාර හාමුදුරුවන්ගේ සර්ව සාධාරණ තීන්දුවෙන් පසු හොඳින් හැද පැළඳ සිටි ඒ සුදු මහත්තයාගේ ඇගේ එල්ලී ඇය මෝටර් රථයට ගොඩවී නික්ම යන තුරු බලා හිටියත්, මගේ ඇස්, මස්, ලේ නහර තුළින් ඇය තාම නික්ම නොගිය බව ඇයට නොපෙනෙනවා ඇත.

මැණික්හින්නේ කපු මහත්තයා මා දවසක් කුලී වැඩකට ගෙට ගොඩවනවාත් සමඟම අම්මා සහ අප්පච්චී සමග මොකක්දෝ බර කථාවක් කළ බව මට මතකය. එදා හවස ළිඳට නාගෙන එනවිට අම්මා තේ කෝප්පයක් රැගෙන ගේ පිළෙන් හිඳගෙන මගේ අතට දික්කරගෙන මේ කාරණාව පැහැදිලි කළේ මහත් වූ උජාරුවෙන් මෙන්ම ලොකු වගකීමකිණි. මා මේ ගැන එතරම් උනන්දු නොවන බැව් අම්මාට නොපෙන්නුවත්, මගේ පසුතලය අතර, අමුතුම ආස්වාදයකින් පිරීගිය බැව් මටම වැටහී ගියේ ය. පිරුණු ඇඟ පත, රතු තොල් පෙති, දිගටි මුහුණ, දිගු වරලසක් සහිත අහිංසක පෙනුම ඇති ස්ත්‍රී රූපයක් ඇදී එදින රාත්‍රිය පුරාවට හොල්මන් කරන්නට පටන් ගත්හ. එදින රාත්‍රිය මට මහා දිගු රාත්‍රියක්ම විය.

සිරිත් පරිදි පවුලේ ඥාති කිහිප දෙනෙකුට කියා වැඩි විය පැහැදමකින් තොරව සඳමාලි නිවසට කැන්දාගෙන ආවා මට දුන් මතකය. එදින මගේ ජීවිතයේ වැඩිම සතුට පිරුණු දිනයක් බව මතකයේ ලියා තැබිය හැකිය. සඳමාලිගේත්, මගේත් මඟුලට ලබාගත්තු ණය මුදල ගෙවා ගැනීමට බැරි වූ විට පහළ වත්තේ පොලී මුදලාලි දවසක් පැමිණ අම්මාටද බැණ වදිමින් වත්තේ සන්තකටම තිබූ කොස්ගස් හතර කපාගෙන ගිය දවසද සඳමාලි පළමුව මා හා උරණ වන්නට පටන් ගත්තේය. එදින අම්මා හා අප්පච්චි හෙළු පුසුම් එමටය. සඳමාලි එදා කීවේ තමුසෙල මාව රවටාගෙන ඇවිත් මගේ ජීවිතය විනාශ කරල ඉවරයි කියලයි. මා කුළියක් කර සොයාගත් සොච්චම ගේ දොර වියදම් පිරිමසා ගැනීමට කිසිසේත් නොසෑහේ. නමුත් සඳමාලි මගෙන් රෝස පවුඩර්, සුවඳ විලවුන් ඉල්ලයි. සැබෑවටම ආර්ථික අපහසුකම් වලින් මගේ ගෙපැළ පිරී තිබූ බව නම් නොරහසකි. එනමුත්, සඳමාලි මා හැරදමා යෑමට තරම් එය ඉවහල් වේද යන්න මා කිසි දිනක නොසිතුවෙමි.

සෑම පුරපසළොස්වක පොහොයකම පුර සඳ වළාපෙල මැදට ගැම්බරව මට ඔච්චම් කරයි. සඳමාලි මගෙන් ඉල්ලා සිටියද ගැඹුරු බව සඳ සොරාගෙන ගියා දැයි විටෙක මට හැඟේ.

මේ අයියෙ... හැමදාම කුලී වැඩක් හොයාගෙන නොගිහින් මගේ මුහුණ දිහා බලාගෙන ඉන්නෙ මාව ගිලින්නද ඕයි.. රෑ තමුසෙ හිටියට මම තාම වඳ පීදිච්ච කෙසෙල් ගසක් වගේ යැයි දිනක් ඇය මා හට ගෝරනාඩු වූ හඬ අවට අයටත් ඇසෙන්නට ඇත.

දුක් ශෝක කම්කටොළු නිවන දිව්‍ය ඖෂධයෙන් හොඳට උගුර තෙමාගෙන රා තැබෑරුමට ගොස් එන විට සියල්ල සුව සේ නිදියන මහ රෑ දොළහ පසුවී ඇති බව සැබෑය. එදින මා කඩුල්ල පනින විට පැල තුළ කසුකුසුවක් ඇසෙන්නට විය. මා දොර ළඟට වී සඳමාලිට කීප වරක්ම කෙඳිරුවද එලක් වූයේ නැත. නිමේෂයකින් දොරපියන හැරගත් සඳමාලි අමිහිරි වචන පෙළකින් මහා හඬින් පවසමින් මා ඉදිරියට පැමිණියා ය. සක්කිළියෙක් වගේ මළ ජරාව කට ගාගෙන ඇවිත්.... මේ මිනිහට තඹ සතේකටවත් ගාණක් නෑනෙ... කියා වේගයෙන් නැවත දොර පළුව වසා ගත්තා ය. දෙනෝ දාහක් ඉදිරියේ මා නිරුවත් වූවා යැයි මට හැඟින. කැදැල්ලෙන් වෙන් කළ වල් ඌරු පැටවෙකු සේ ... මා එදින රැය ස්තෝප්පුවේ පිල්කණ්ඩිය මත ගොම මැටි සුවඳ විඳගනිමින් රැය පහන් කළෙමි.

ඇය මට ඇමතූ අයුරු මාගේ පපු කැනැත්තට කොහෙත්ම ඔරොත්තු නොදී ය. හරියට විදුලි සැරක් වැදුනා මෙන් දැණින. එදින මගේ පුරසඳ රාහු විසින් ගිලගෙන හමාරවී ඇති බව හොඳාකාරවම හැටහුණේ ය. සඳමාලි කෙසේ කීවත් මිනිසෙකු සක්කිළියෙකු හෝ රජෙකු වන්නේ උපතින්ම නොව ඔහුගේ ක්‍රියා කලාපයෙන් බැව් දවසක් ඉස්කෝලේ ලොකු සර් කීවා මට යන්තමට මෙන් මතක ය. පවතින නීතියෙන් සඳමාලීත්, මමත් උසාවියෙන් වෙන් වූවාට මගේ හිතේ ඉපදුන ඇය ගැන ආදරය, කරුණාව තවමත් මා තුළ දළුලා වැඩේ.

මා මත් වතුර බී ගෙන වැඩි වූ දිනක ආදරය සුන්දර යැයි පැවසූ විට. සුන්දර ආදරය කන්නද කියා මද්දුවා ඇසුවේ චූටියාගේ රා පැළේදී ය. සඳ නැති කළුවර රැයක මට පිටුපා නිදා සිටි සඳමාලිගේ ගෙල හරහා මා අත යෙදූ විට මගේ අත අල්ලා පැත්තකින් තැබුවේ ඉතා අප්පිරියාවෙන් මෙන් ය. මේ මිනිහ තිරිසන් වෙලා ආයෙ ගන්න දෙයක් නැතැයි යැයි මුමුණනු හඬ මට නෑසුනා නොවේ.

එදා පිළිමතලාවෙන් ගත් සඳමාලිගේත් මගේත් මඟුල් ෆොටෝ එකේ සඳමාලී මගේ අත අල්ලාගෙන සිටි සඳමාලීද මේ සිනාසීගෙන මා ළඟ සිටින්නේ ඔච්චමට දැයි මට සිතේ. ඒ අතීත මතක සැමරුම දෑතින්ම ඉහළට ඔසවා පොළවේ ගසා දැමුවා ය. මේ වන විට වයෝවෘද්ධව සිටි අම්මා ද හා අප්පච්චීද මෙලොවින් සමුගෙන හමාරය. සතියක් දෙකකට වැඩි ගෙපැල තුළ වළඳක් ලිපේ නොතැබූ තරම්ය. ගෙදර ආරක්ෂාවට හදපු බල්ලා මගේ කකුලේ ඇතිල්ලෙන්නට විය. මා ඔහුටද පාපහරක් දුනෙමි. ඌ කෑ ගසාගෙන නොපෙනී දිව ගියේ ය. නමුත් මේ තිරිසන් සතා මේ කිසිවක් දන්නේ ද රෑ මා මේ දින කිහිපය බඩගිණි නිවා ගත්තේ පොලී මුදලාලිගේ කඩෙන් ය. උයන්ට

පිහන්ට කෙනෙක් නැති මේ පැලේ ඇති හැලි වළන් වලින් කුමකට ද යැයි සිතා ඒවාද කුඩුකර දැමුවේ සිතේ වූ ආවේග යෙනි. නැවතත් අනාගතයක් ගොඩ නගන්න තරම් කිසි පිරියක් නොමැත. සියලුම දුක් දොම්නස් වලින් ජීවිතය ගිණිගෙන හමාරය සඳමාලි අර කඩවසම් තරුණයා සමග සතුටින් ජීවත් වෙනවා ඇත. බුදු දහමේ පවසා ඇති පරිදි කිසිවෙකුට වෛර කිරීමෙන් බවය තර වනු ඇත. දෙවියන් වහන්සේ මා වෙත ලබා දුන් මේ ලස්සන ජීවිතයේ අවසාන කාල පරිච්ඡේදයට දුන් මා පැමිණ ඇති බව වැටහෙනු ඇත. මට දුන් කිසි දෙයක් ගැන සිතන්නට නැත. මා නුවර කොළඹ මාර්ගයට කෙමෙන් කෙමෙන් පැමැණියෙමි. එදා හොඳටෝම වැහිබර දිනයකි. රාජකාරි වලින් මිදී හා නොයෙකුත් අවශ්‍යතාවයන් සඳහා මහනුවර සිට කොළඹ දක්වා ගමන් කරන මගීන් හට මාර්ගයේ පුළු ප්‍රමාදයක් වන්නට පුළුවණි. ඒ සඳහා මා දෙවියන්ගෙන් සමාව අයදිමි මට වෙන කිරීමට හෝ සිතීමට කිසිවක් සඳමාලි හා මා අතර ඉතිරි කර ගොස් නොමැත.

මා ඉතා සන්සුන්ව නුවර සිට කොළඹ බලා අධික වේගයෙන් ගමන් කරන බස් රථය පෙරට පැන්නෙමි. රියදුරාගේ කන් අඩි බිහිරි කරවන නලා හඬ මට තරමක් ඇසිණි. බස් රථය මා පදුකර තිරිංග තද කර මඳ දුරක් ගොස් නවත්වන්නට ඇත. පසු දින මා පැල්පතට ඉහළින් තිබූ පොදු සුසාන භූමියේ කවුරුන් හෝ විසින් සදාකාලික වූ නිදි සුවය පතා මිහිදන් කරන්නට ඇත. මගේ සෙනෙහසේ මිහිර සඳමාලි කොතෙක් දුරට තේරුම් ගන්නට ඇද්ද යන්න මා නොදන්නේ ය.


**නි/7418 ලුතිතන් ආර්එම් දිසානායක ශ්‍රීලපාහ**
**2(සේවා) ශ්‍රීලපාහ**


# රෙජිමේන්තුව ලද තුති මල්

**රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති හා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක හා ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ උපදෙස් මත සිදු කරන සමාජ සේවය වෙනුවෙන් රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත ප්‍රසාදය දක්වා එවන ලද ලිපි දෙකක් මෙසේ වයිට් හැකල් සඟරාව තුළින් පළ කරනු ලබයි.**

රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රාජකාරි කර යුද හමුදාවෙන් විශ්‍රාම ලබා සිටි ලුතිතන්(උපා) විශ්‍රාමික වයිජී සෝමරත්න ශ්‍රීලපාහ 2013.03.13 දින හෘදයාබාදයකින් මියගිය අතර, රෙජිමේන්තු මධ්‍යස්ථානයෙන් ලබාදී තිබූ දායකත්වය පිළිබඳව ස්තූතිය පළ කර මියගිය නිලධාරිගේ බිරිඳ විසින් එවා තිබූ ලිපියකි.


රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී 2013.03.17 වන දින පැවති ශ්‍රී ලංකා පාබල හමුදා සංගමය වෙනුවෙන් ශ්‍රීලපාහ රෙජිමේන්තුවෙන් ලද දායකත්වය පිළිබඳව එහි වත්මන් ගරු සභාපති මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ටීටීආර් ද සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී විසින් එවා තිබූ ලිපිය.





## සංස්කාරක සටහන

ශ්‍රී ලංකා යුද හමුදාවේ පළමු වරට මුද්‍රණය කර පලකළ සඟරාව ලෙස සැලකෙන 1952 වසරේ ප්‍රකාශිත "The Ceylon Army Journal" නමැති ප්‍රකාශනයෙන් ලබාගන්නා ලද ලිපි 72 වන කලාපයේ සිට පලකරනු ලැබේ.




## සිදුවීම් දිනපොත 1949 - 1952

| | |
|---|---|
| 20 මැයි 1949 - | රජයේ යුද්ධ හමුදා උපදේශක වශයෙන් බ්‍රිගේඩියර් අර්ල් ඕ කෙයිත්නස් ලංකාවට පැමිණීම. |
| 10 ඔක් 1949 - | යුද හමුදා පනත නිර්මානය වීම. |
| 10 ඔක් 1949 - | ප්‍රථම යුද හමුදාපතිවරයා වශයෙන් බ්‍රිගේඩියර් අර්ලි ඕ කෙයිත්නස් පත් කිරීම. |
| 10 ඔක් 1949 - | ප්‍රථම නිලධාරීන් අධිකාරියට පත් කිරීම |
| 10 ඔක් 1949 - | යුද හමුදා මූලස්ථානයේ ආරම්භය |
| 11 ඔක් 1949 - | ප්‍රථම යුද හමුදා කෙඩෙට් නිලධාරීන් බඳවා ගැනීම |
| 12 ඔක් 1949 - | ප්‍රථම නිලධාරියා සහ ප්‍රථම කෙඩෙට් නිලධාරී කණ්ඩායම පුහුණුව සඳහා එක්සත් රාජධානිය කරා පිටත්වීම. |
| 30 ඔක්1949 - | ප්‍රථම කොමිෂන් නොලත් නිලයන් බඳවා ගැනීම. |
| 01 නොවැ 1949 - | එච්ලොක් බැරැක්ක නිල වශයෙන් උත්සවාකාරව බ්‍රිතාන්‍ය හමුදාවන්ගෙන් ලබා ගැනීම. |
| 12 නොවැ 1949 - | ආධුනික පුහුණු මධ්‍යස්ථානය ලෙස දියතලාව CVF කඳවුර තෝරා ගැනීම. |
| 01 දෙසැ 1949 - | යුද හමුදා ජනපදයක් සඳහා ප්‍රථම ඉඩම් කොටස අත්කර ගැනීම. |
| 27 ජන 1950 - | ආධුනික අංශය ස්ථාපනය කිරීම. |
| 01 පෙබ 1950 - | ප්‍රථම ආධුනික සෙබළුන් බඳවා ගැනීම. |
| 01 පෙබ 1950 - | යුධෝපකරණ වැඩපල ස්ථාපනය කිරීම. |
| 04 පෙබ 1950 - | ප්‍රථම නිදහස් දින පෙළපාළිය උත්සවාකාරව පැවැත්වීම. |
| 30 මාර්තු 1950 - | කොළඹ තිබූ යුද හමුදා රෝහල බ්‍රිතාන්‍ය හමුදාවන්ගෙන් ලබා ගැනීම. |
| 15 මැයි 1950 - | 1 ශ්‍රීලපාහමුලස්ථානයපිහිටුවීම. |
| 02 ජුන 1950 - | ආධුනික පුහුණු මධ්‍යස්ථානයෙන් පුහුණුව ලැබූ පළවන ආධුණික සෙබළ කණ්ඩායමේ විසිරයාම. (විසිරයැම පෙළපාලිය සඳහා මේජර් නුගවෙල සහභාගී විය). |

## මගෙ සිහිනය නුඹයි

නින්ද නේන පාළු රැයක
දොර අගුලු ඇරන්
මටත් හොරෙන් සිතට එන්න
ආදරෙත් අරන් ...

සඳ සාවිය හොරෙන් ඇවිත්
තරු පොකුරු අරන්
ආදරේට මිහිරි කවිය
හඬවතට කියන් ...

සෑසෙ මදුශංක එම්ටිඑම්
බුද්ධි අංශය - 12 ශ්‍රීලපාහ

## නුඹේ සිහිනය මමයි

මගෙ හදවත පුරා වැලපෙන
සිහින කවියක් වෙලා
ඔබේ ගීයක ආදර සියලක්
මිහිරි ගී තනුවක් වෙලා

ඇයේ තවමත් ඔබේ දෙසවන්
සතුටු කළ පැතුමක් වෙලා
ඔබේ හදවත සදා කාලික
හදවතෙ සිතුවමක් වෙලා

ඕකේ අශේනි රසාංගිකා
තිස්සමහාරාමය

## අහිමි පෙම

ලියන්නෑ මං තවත් කවියක්
ඔබේ සෙනෙහස ගලපලා
ඒ දෙනෙතින් දුටුව සිහිනය
මගේ කඳුලින් බොඳවෙලා
මිරිඟුවක් වී මැවූ ලෝකය
ගව් ගණන් දුර විසිවෙලා
අපට අප නැති ලොවක අද
අපේ ජීවිත නැවතිලා
වසන්තයෙ එක ලස්සන දවසක
අහම්බෙන් නෙත් හමුවෙලා
සුන්දරයි අප එක්ව ආ මග
ආදරෙන් අත් පටලලා
අඟුලු දැම්මත් එමන් සලකුණු
හිතේ මුල්ලක සඟවලා
හරත නෑ මං කවදාවත්ම
ගියත් ඔබ මා තනිකර දාලා

ආසෙ සම්පත් කේවට්කේ
ඩී කණ්ඩායම - 12 ශ්‍රීලපාහ

# ලාංකීය පුරා විද්‍යාත්මක උරුමය

ලංකාවේ මානව ජනාවාස කරණය ආරම්භ වනුයේ දල වශයෙන් අදින් වසර ලක්‍ෂ 20කට පමණ ගල්යුගයේ හෙවත් පැලියෝතික අවධියේදීය. අදින් වසර ලක්‍ෂ 7-8කට පූර්ව කාලයකට දින නියම කළ හැකි යාපනය අර්ධද්වීපයේ 'මයික්කායි' ගම්මානයෙන් ලැබුණු ගල් මෙවලම් දනට හඳුනාගෙන ඇති පැරණිම මානව සාධකය වේ. මධ්‍යම ගල් යුගය හෙවත් මෙසොලිතික අවධියේ මිනිසා බළන්ගොඩ මානවයා නමින් හඳුන්වමු. මෙම අවධියට අයත් ඉපැරණිම සාධක බණ්ඩාරගම පාහියං ගල්ලෙනින් හමුවෙයි. ඒ අදින් වසර 37000කට පෙරය. ගල් යුගයේ සිට සතුන් හීලෑ කළ එඬෙර ගොවි යුගය හෙවත් නියොලිතික යුගයට පරිවර්තනය වීම අදින් වසර 20000කට පෙර සිදු වූ අතර, මේ කාලයේදී සාදක හෝර්ටන් තැන්නෙන් ලැබී ඇත.

ක්‍රි:පූ: 1000 පමණ වන විට එනම් අදින් වසර 3000කට පමණ පෙර මිනිසා කෘතිම වාරි මාර්ග තනා ඒ ජලයෙන් වී වැපීමත්, අශ්වයන් සිය දෛනික ගමනාගමන අවශ්‍යතා සඳහා යොදා ගැනිමත්, කාලරත්න මැටි බඳුන් නිපදවීමත්, මේ සියල්ලට වඩා යකඩ භාවිතයත් ඇරඹීය. මෙම අවධිය මහා ශිලා අවධිය, මෙගලිතික අවධිය, යකඩ යුගය යන නම් වලින් හඳුන්වනු ලැබේ. ක්‍රි:පූ: 1000ක් පමණේදී ආරම්භ කරන ලද වැව්, ඇල, අමුණු තැනීමේ ක්‍රියා දාමය ක්‍රිස්තු වර්ෂ ආරම්භයෙන් ඉන් අනතුරුව එලඹි සියවස් වලත් අඛණ්ඩව ක්‍රියාවේ යෙදී ඇත. වාරි කර්මාන්තය කොතරම් පැරැන්නා ප්‍රගුණ කළේද යත් පුරාණ ලාංකීය වාරි ඉංජිනේරු ශිල්පය පුරාණ ලෝකයේ අග්‍රස්ථානය තැනක් ලංකාව දිනා සිටියේය. සිගිරි බලකොටුවේ වාරි තාක්‍ෂණය ලෝකයම මවිත කර ඇත. රාවනා රජු විසින් දඬුමොණරයක් තනා ඉන්දියාවට ගොස් සීතා දේවිය පැහැර ගෙන නැවත ලංකාවටආ බව සනාත වී ඇත. එකළ සිටි රජවරු තාක්‍ෂණික නිමැවුම් කරුවන් විය. මෙම කුඩා දිවයිනෙහි වැව් 34000 ක් පමණ සංඛ්‍යාවක් ඇතැයි දනට ගණන් බලා තිබේ. වාරි තාක්‍ෂණික දියුණුව නිසා මෙහි ප්‍රතිපලයක් ලෙස දිවයින බත බුලතින් සරු කිරීමටත් එහි අවසාන ප්‍රතිපලය ලෙස දිවයින ආර්ථික වශයෙන් සමෘද්ධිමත් රටක් බවට පත් කිරීමටත් පැරැන්නාට හැකි වී ඇත.

මෙම ආර්ථික දියුණුව මිනිසාගේ අධ්‍යාත්මික දියුණුව ද හෙළි පෙහෙළි කර දීමේ ප්‍රතිපලයක් ලෙස අපි ශ්‍රේෂ්ඨ සංස්කෘතියටද උරුමකම් කියා පෑවෙමු. ඉදිකිරීම් ශිල්පය තාක්‍ෂණය, කලා නිර්මාණය, සාහිත්‍යයද ක්ෂේත්‍රයන් ලොව බොහෝ පැරණි ලෝකයේ උසැතිම ගඩොල් ස්මාර්කය වන ජේතවනාරාම දගැබ හා ලොව උසැතිම මහල් ගොඩනැගිලි කිහිපයකටද ලාංකිකයා උරුමකම් පෑහ. මේ අතර මහල් 09කින් යුත් ලෝවාමහපායක් මහල් 12කින් යුත් පොළොන්නරුව බුද්ධි සීමා ප්‍රාසාදයක් ප්‍රමුඛය. එසේම ලොව කවර හෝ ජාතියකට අයත් ශ්‍රේෂ්ඨ කලා කෘති සමග උවද තරඟ කළ හැකි මට්ටමේ කලා කෘති මෙම ලංකාද්වීපයේ පහළ වී ඇත. එසේ නම් අප ලංකාද්වීපය ලොව ඇති රටකට වඩා ප්‍රමුඛ ඉතිහාසයක උරුමකම් ඇති රටක් බැව් අප සියලු දෙනා අදිටන් කරගත යුතුය. මේ ලංකාද්වීපයේ ලොව මවිත කළ පෞරාණික ස්ථාන අප සියලු දෙනා තම ජීවිතය මෙන් ආරක්‍ෂා කළ යුතුය. ලංකාද්වීපයේ ප්‍රෞඪ ඉතිහාසය විනාශ වීමට ඉඩ නොතබා එම ඉතිහාසය මතු පරපුර වෙනුවෙන් රැකගමු.

ලාංකීය උරුමය" කෘතියෙන් අපුටා ගැනීමකි.

**ලුතිනන් එච්ආර්එන් සංජීව ශ්‍රීලපාහ - 4 ශ්‍රීලපාහ**

# ළමා ලෝකය

ළමා පරපුර ළමා ලෝකය යනු ඉතා සුන්දර ලෝකයකි ඔවුන්ගේ මනස ඉතා සැහැල්ලුය. පියකරුය ඒ මනස තුළ විෂබීජ නොමැත ඇත්තේ ඉතා සැහැල්ලු සුවඳ හමන පිවිතුරු රසවත් අදහස් පමණි. පොඩි දරුවන් මල්වලට උපමා කර ඇත්තේද එබැවිණි.

දරුවන් පිළිබඳව සමාජයේ කතා කරන සොයා බලන පිරිස අඩුවී ඇත. කුඩා දරුවකු මවුකුසින් මෙලොව එළිය දුටු තැන් පටන් මවගේ පියාගේ සෙවනේ හැදී වැඩී ටිකෙන් ටික වැඩීමත් සමග ඒ දරුවා පිටස්තර ගුරුවරයෙකු හෝ ගුරුවරියක සෙවනේ හැදෙන්නට වැඩෙන්නට පටන් ගනී. ඒ දරුවාගේ අනාගතය පිළිබඳ හොඳ හෝ නරක තීරණය වන්නට පටන් ගන්නේ එතැන් සිටයි.

පෙර පැවති අධ්‍යාපනය රටාවට වඩා හාත්පසින්ම වෙනස්වූ අධ්‍යාපන රටාවක් අද සමාජය තුළ දක්නට ඇත. ළදරු පාසල් අවධියේ පටන්ම අධ්‍යාපනය සඳහා විශාල කැපකිරීමක් සිදු කිරීමට දරුවාට සිදුවී තිබේ. ඒ අධ්‍යාපනයේ අද තිබෙන්නා වූ තරගකාරීත්වය හේතුවෙණි. පළමු වසරේ සිට පස්වන වසරේ ශිෂ්‍යත්ව කඩයිම පසු කරන තෙක්ම දරුවකුට ඉතා විශාල බරක් තම පුංචි මනසේ සිරකර තබා ගැනීමට සිදුවී තිබේ. එය එසේ නොවුනහොත් එම කුඩා දරුවා හට තරගකාරීත්වයෙන් අධ්‍යාපනයේ ඉදිරියට යාමට නොහැකි වනු ඇත. කෙසේ වෙතත් මෙය අද පවතින අධ්‍යාපන ක්‍රමයක් සමග වැරදීයයි සිතීමට නොහැක. කෙසේ වෙතත් මෙලෙස දරුවාගේ මනස වෙහෙසකාරී බවින් මුදවා ගැනීමට හැකි සෑම පියවරක්ම දරුවා වෙත ළඟා කරවීමට ගුරුවරුන්ට මෙන්ම දෙමාපියන් හටද ලොකු වගකීමක් පැවරී ඇත.

දරුවාගේ මනස වෙහෙසකාරී බවින්, පීඩාකාරී බවින් මුදවන්නේ කෙසේද? ඒ වෙනුවෙන් දෙමාපියන්ගේ කාර්යය භාරය කුමක්ද? දරුවා සතියේ දින පහේම පාසැල් ගොසින්, සවස පංති වලට සහභාගි වෙමින් මනස ඉතා නොසන්සුන් තත්ත්වයකට පත්ව තිබේ. මෙලෙස තිබියදීත් ඇතැම් දෙමාපියන් සෙනසුරාදා, ඉරිදා දිනයන් දෙකේදීත් මේ පුංචි පැටවුන්ව අමතර පංති සඳහා යෙදවීමට උත්සාහ කරයි. අඩුම තරමේ එක් දිනයක් හෝ දරුවාගේ සතුට වෙනුවෙන් යෙදවීමට දෙමාපියන් වශයෙන් ඔවුන් සිතට ගත යුතුව ඇත. දරුවාට හොඳ නරක කියා දීමට, සමාජයේ වැදගත් පුරවැසියෙකු ලෙස ජිවත් වීමට ඉගැන්වීමට, දරුවා සමග එක් වී සෙල්ලම් කිරීමට ඒ දිනය යොදා ගැනීමට මව්පියන් සිතට ගත යුතුව ඇත. එය දරුවාගේ මනසට ඉතාමත් සහනයක් වනු ඇත. එසේම කුඩා දරුවන්ගේ පුංචි මනස ඉක්මණින්ම සැලෙන සුලුවේ. ඔවුන් හට කතා කිරීමේදී ද ඔවුන්ගේ මනසට හානිදායක නොවන අන්දමින් කතා කිරීමට දෙමාපියන් වග බලාගත යුතුය.

එසේම ගුරුවරුන් හටද දරුවන්ගේ මනස පිළිබඳව අවධානය යොමු කිරීමට සිදුවේ. මන්ද දවසේ වැඩිම වේලාවක් දරුවා ගත කරනුයේ ගුරුවරයා සමගයි. දරුවාට අධ්‍යාපනය ලබාදෙන අතරම දරුවාට ආදරය කිරීමද ගුරුවරුන් වශයෙන් ඔබ සිදු කළ යුත්තකි. එසේම දරුවා පන්තිය තුළ නිශ්ශබ්දව තබා ගැනීමට ද ඔබට විශේෂ හැකියාවක් තිබිය යුතුය. දරුවා යනු මනස ඉතා ඉක්මනින් වෙනස් වන අයෙකි. ලස්සන දේට ඇස් යොමුවීම, ලස්සන හඬට කන් යොමු කිරීම, හිනා වෙන්නට වැඩි කැමත්තක් දක්වීම එසේම පොඩි දෙයටත් හැඩීමට තැත් කිරීම ළමා මනසේ ස්වභාවයයි. එය ගුරුවරයා මෙන්ම දෙමාපියන් ද ඔබ අප හැම දෙනාම හොඳින් අවබෝධ කරගත යුතු අතර ඒ අනුව දරුවා තම ග්‍රහණයේ රඳවා ගැනීමට වග බලා ගත යුතුය.

අපේ අනාගතය දරුවන්ය. රටේ අනාගතයද දරුවන්ය. එම නිසා අපේ වටිනාම සම්පත දරුසම්පතයි. ඔවුන් යහපත් පුරවැසියන් කිරීම ඔවුන්ට හොඳින් අධ්‍යාපනය ලබා දීම ඔබගෙත් මගෙත් පරම යුතුකමය. එබැවින් පුංචි පැටවුන් කෙරෙහි අද පවතිනවාට වැඩියෙන් අවධානය යොමු කිරීමට ඔබ අප සියලු දෙනා සිතට ගත යුතු වේ.

පියවරු මවුවරුන් හට මෙය වැට                    හේවා
සිය දරු පැටව් ඇස්දෙක මෙන් රැක                    දේවා
බිය සැක නැතිව පොඩි පැටවුන් ලොකු                    වේවා
ජය වේවා ළමා ලොව හෙට බැබ                    ලේවා

**සෙ/329809 සාංසෙ උදය කුමාර ජීඑල්ආර්**
**රෙම ශ්‍රීලපාහ - තුවාක අංශයු**

# කාලයේ පහර කා ඉරී තැළුනු රූ සපුව

දිදුලන පැහැපත් සමක්, සුන්දර සිරුරක්, නිරෝගිමත් සිරුරක්, ලබා ගැනීමට ඔබට දින කියක් උවමනාද? විද්‍යුත් මාධ්‍ය ජාලය තුළින් ඔබ ඇස දුටු දේවල් අනුව නම් සති දෙක තුනකදි උපරිම මාසයකින් එය සිදු කර ගැනීමට පිළිවන් වෙයි.

එහෙත් ඒකී දිදුලන සමක්, පැහැපත් නිරෝගිමත් සුන්දර සිරුරක් මොන තරම් කාලයක් පවතිද? රූපවාහිනියේ හෝ වෙනත් මාධ්‍ය ජාලයක එවැනි දසුනක් මවා දෙන කිසිවෙක් ඒ ප්‍රශ්ණයට නම් පිළිතුරක් දෙන්නේ නැහැ.

පුද්ගලයෙකු නැමැති ඒකකය සකස් වී ඇත්තේ රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාන යන උපාධානස්කන්ධ පහේ එකතුවෙනි. රූපය - පෙන පිඩක් වැනිය. වේදනා - දිය බුබුලක් වැනිය. සංඥා - මිරැගුවක් වැනිය. සංඛාර - කෙසෙල් කඳකට උපමා කර ඇති අතර, විඤ්ඤානය මායාවක් වැනිය. බුදු දහම අනුව ඒකී ස්කන්ධ පහම අනිත්‍ය අසාර කොටස් වෙයි. එබැවින් ඒ එක් කොටසක් වත් 'ආත්ම' නමින් සැලකිය හැකි කිසිදු තත්ත්වයක් දැකිය නොහැකියි. ඒවායේ ආත්ම නැතිනම් එම කොටස්වල එකතු වූ පුද්ගලයා තුළ ආත්මයක් කෙසේ තිබිය හැකිද? සත්‍ය වශයෙන්ම නැත. අනිත්‍ය වූ පංචස්කන්ධයේ පමණක් නොව සංස්කාර ක්ෂයට අයත් වන කිසිවෙකු 'ආත්ම' නම් තත්ත්වයක් නැත. ඊට හේතුව සංස්කාර අනිත්‍ය හා දුක් සහගත වීමයි. අනිත්‍ය වූ දේවල් හෝ පුද්ගලයන් හෝ තුළ නිත්‍ය වූ දෙයක් බලාපොරොත්තු විය නොහැකිය.

ලස්සන රූපයන්ට අපේ සිත බැඳී යන්නේ මේ අනිත්‍යභාවය ගැන අවබෝධයක් අපිට නැති නිසයි. ඒ නිසයි කාලයෙන් කාලයට එන තාලෙට අපි අලුත් මුහුණුවලට බැඳී යන්නේ මේ සඳහා අපිට තියෙන්නේ මොන තරම් පටු අවබෝධයක්ද? එදා විද්‍යුත් මාධ්‍යයන්වල රූ සපුව රැක ගැනීම සඳහා එක එක ආලේපන වර්ග සබන් වර්ග අප වෙත අරගෙන ආපු පිරිස අද අපට පෙන්නවත් නැහැ. හැබැයි අර ආලෙපන වර්ග ටිකයි සබන් වර්ග ටිකයි නම් තවමත් දකින්න ලැබෙනවා. එදා හිටපු ඒ අය වෙනුවට අලුත් අලුත් මුහුණුවල් ප්‍රබල නිර්දේශ අරන් එනවා.

එහෙනම් ලස්සන වීමේ රහස අපිට කියා දුන් පිරිසට මොකද වුනේ? අද ඒ අයගේ රූප ස්භාවය කොහොම ඇතිද? කිහිප දෙනෙක් හරි මුනගැහෙන්න දකින්න ලැබුනා නම් අර සිනමා තරුවලට නොදෙවෙනි වෙනසක් ඒ වෙළඳ දැන්වීම් තරුවලත් ඇති වෙලා තියෙන බව දකින්න පුලුවන් වෙයි. පිරිසක් අප ඉදිරියට රූපයේ ගුණ කියවා. තව පිරිසක් ලස්සන වෙන මග කියනවා. ඒ වගේම තවත් පිරිසක් සුවඳ විලවුන් අරගෙන ඇවිල්ලා ඒ සුවඳ හැමෝගෙම සිත් දිනා ගන්නා හැටි පෙන්නවා. ඒ සුවඳ භාවිතා කරන්න කලින් කිසිවකු නොබලන්නත් සුවඳ නිසා අනෙක් පිරිස හැරී හැරී බලන්නත් හේතුව සුවඳ විලවුන් භාවිතා කරන කල් ඔවුන් ගඳ ගසමින් සිටී නිසාද කියලත් ප්‍රශ්නයක් නම් තියෙනවා. ඒවාගේ දෙයක් ප්‍රසිද්ධියේ පිළිගන්න එක නම් පුදුමයක්. කොහොම උනත් එදා පෙන්නපු රූපවත්, ලස්සනවත්, සුවඳවත් අද වෙනකල් පැවතුනේ නැහැ. මේක අවුරුදු දහස් ගණනක් ගිහින් සිදුවුනු වෙනසකුත් නෙමෙයි. ඇත්තටම ඉටි රූප වගේ බැබලුනු සුවඳ වහනය වුනු සඳුන් වත්සුනු වලින් සැරසුනු ශරීර අද කෝ? ඒ අයට මොකද වුනේ? තනි රැල්ලක්වත් නොතිබුනු ඒ ශරීර අද රැළි ගැහිලා. සෘජුව තිබුණු කය අද කුදු වෙලා. කලුවට තිබුණු කෙස් හැලිලා. මාංශ කල්‍යානය මේදයෙන් පිරිලා එල්ලා වැටිලා. සුදෝ සුදු දසන් දුර්වර්ණ වෙලා. ඉටි රූප ටික කිසිම හැඩයක් නැතිව ඕනෑවට එපාවට කරපු මැටි රූප ටිකක් වගේ වෙලා. එදා තිබුණු සොඳුරු රූපයන්ට අද වුනේ ඒ දේ අද තියන සුන්දරතම රූපයන්ට හෙට වෙන්නෙත් ඒ දේමයි. හෙට ඇති වන කවර රූපයකට උනත් සිද්ධ වෙන්නෙත් එයමයි. සියලු රූපයන්ට පොදු ධර්මතාවය තමයි 'පඨවි, ආපෝ, තේජෝ, වායෝ ' කියන සතර මහා ධාතූන්ගෙන් නිර්මාණය වුනු රූප මේ ඉරණමට ගොදුරු වීමෙන් වලක්වන්න කිසිම විදිහකින් බැහැ.

මීට කාලයකට ඉහතදී සිනමා තිරය වර්ණවත් කළ හැඩකාර සිනමා තරු ගැන මතකය අවදි කරමින් බොහොම සුන්දර රූපයන්ගෙන් ප්‍රේක්ෂක සිත් සතන් අමන්දානන්දයට පත් කළ සම්මි කපූර්, හේම මාලනි, ශර්මිලා තගොර්, අර්නෝල්ඩ්, රිජඩ් ජියර් එදා රිදී තිරය දීප්තිමත් කළ තාරාකවන්ගෙන් අද තියෙන්නේ ඒ අතීත මතක විතරයි. එදා හිටපු ඒ අය පිළිබඳ රූප පෙළක් මේ සමඟ ඉදිරිපත් කරමි.

රූපය ගැන රූපයේ යථා ස්භාවය ගැන සත්‍ය අවබෝධය උපදවා ගත්තේ අතිශය ශ්‍රේෂ්ඨ මනුෂ්‍ය රත්නයක්ය. අනන්ත ඥාන උපදවා ගනිමින් තුන් ලොව දිනූ සුගතයානන් වහන්සේ තමයි මේ ධර්මතාවය ස්භාවයෙන් හු ඥානයෙන් අවබෝධ කොට ධර්මයන් වදාල සේක. සම්මා සම්බුදු ඥානයෙන් උන්වහන්සේ දුටු සතර මහා ධාතූනුත්, සතර මහා ධාතූන්ගෙන් හටගත් දේත් යන රූප උපාධානාස්කන්ධය දුකක් බවයි. අපි දකින සියලු රූප අයත් වන්නේ ඒ දුක් රූප උපාධානස්කන්ධයටමයි. මේ ලෝකේ පරම සත්‍ය වන සම්බුද්ධ භාෂිතය මැනවින් පෙන්වා දෙනවා.

රූපයට ඇලී යාම නිසා රූපය අනිත්‍ය බවට පත්වන විට දුකට පත්වන්නට සිදුවන බවයි. රූපයෙන් ජීවිතයට කිසිදු අර්ථයක් නොලැබෙන නිසා තථාගතයන් වහන්සේ රූපය අසාරවත් වූ හරයක් දක්නට නැති පෙන පිඩුවකට සමානකොට දක් වූයේය. සාමාන්‍ය මිනිසුන් යම් දෙයක දොස් දකින්නේ පිළිකුල්කොට දක්වන්නේ ඒ දේවල් ඔවුන් සතු නොවුනාමයි. ඒත් තථාගතයන් වහන්සේ රූපයේ දොස් වදාලේ රූපයේ යථා ස්වභාවය දැකීමෙන්මයි. දෙතිස් මහා පුරුෂ ලකුණින් ශෝභමාන වූ ඒ ජාත වර්ණ යුක්ත වූ අභිනීල කේෂ කලාපයෙන්ද, අභිනීල නෙත් සඟළකින්ද, මනාව සමව පිහිටි සුදෝ සුදු දසන් වලින්ද යුක්ත වූ තථාගත ශරීරය ඉක්මවන සොඳුරු ශරීරයක් කිසිවෙකුටත් නැහැ. කෙලෙස් සහිත පිරිස් නම් එවන් අග්‍රතම රූපය තමන් උසස් තැනක මාන්නයෙන් පිරීගිය තැනක යොදා ගනිවි. වර්තමානයේ සිදුවන්නේ වැඩිපුරම ඒ දේ තමයි. එහෙත් සම්මා සම්බුදු රාජණන් වහන්සේ මායාව බැහැර කර වූ එකම සත්‍යලෝකය වූ නිසාවෙන් හීන වේවා, ප්‍රනීත වේවා, සියලු රූපයන් හී සැබෑ ස්වරූපය ඒ අයුරින්ම අවබෝධ කොට රූපය යනු නින්දා කටයුතු පිළිකුල් සහගත ස්වභාවය බව ඒකී ස්වභාවය ගැරහීමට ලක් කළ යුතු දෙයක් බව ශ්‍රී සද්ධර්මය තුළින් පෙන්වා වදාලා ඇත.

සොඳුරු රූපයන්ට මිනිසුන් රාග සිතින් ඇලෙනවා. විරූපි දෙයට ද්වේශ සහගතව ගැටෙනවා. ඇතැම් විට ඊර්ෂ්‍යාව හෝ කුහකකම නිසා සොඳුරු රූපයන්ට ගැටෙන අවස්ථාත් තියනවා. ඇලෙන්නෙවත් නැතිව ගැටෙන්නෙවත් නැතිව ඉන්න පුලුවන් වුනොත් බොහෝ වේලාවට එවන් රූප නිත්‍යයි හා භද්‍ර සහිත වශයෙනුත්, සැප වශයෙනුත් ගෙන මුලාවට පත් වෙනවා. රාගයත්, ද්වේශයත්, මෝහයත් පවතින්නේ යහපත පිණිස නම් නොවේ. අකුසල මූලයන්ට රුකුල් දෙන දෙයක් ප්‍රසංශනීයද? නින්දා කටයුතුද? මෙයට උත්තරයක් නම් දෙන්න දෙගිඩියාවක් නම් තිබෙන්නට බැහැ. නිසැක වශයෙන්ම එවැනි දෙයක් නින්දා කටයුතුය. ගැරහීමකට බඳුන් කළ යුතුය.

ලස්සන වෙන්න එපා හෝ ලස්සනට ඉන්න එපා කියලා බුදු දහමේ කියවෙන්නේ නැහැ. අලුත් විලාසිතා, සුවඳ විලවුන් ආලේපන භාවිතා කරන්නට එපා කියා අදහසක් එයින් ගෙන දෙන්නෙත් නැහැ. ලස්සනට නැතිව කැතටයි ඉන්න ඕනී කියලා සෘණාත්මක සංකල්පයක් බුදු දහමේ නැහැ.

පිටුව 27 .......

# 15 ශ්‍රීලපාහ පුවත්

## බලඇණි පුහුණුවීම්

කන්දක් සේ නොසැලෙමු
දූලගක් සේ පැතිරෙමු
ගින්නක් සේ පහර දෙමු
පුහුණුවෙන් පෙළ ගැසෙමු

උද්ඝනයෙන් යුතුව 2008 ජනවාරි මස 03 වන දින මානුෂීය මෙහෙයුම් ක්‍රියාන්විතයට සෘජුවම දායකවීම සඳහා පිහිටුවනු ලැබූ අප ඒකකය ප්‍රථම වරට 2013.02.20 දින සිට 2013.04.01 වන දින දක්වා 22 සේමු තාවුල්වැව බලඇණි පුහුණු පාසලේ සාමූහික බලඇණි පුහුණුවීම් සිදු කරන ලදී.



මෙම පුහුණුව සම්ප්‍රදායික පුහුණුවක් නොකොට අදට ගැලපෙන අර්ථයෙන් දැනුමින් හා හැකියාවන් සපිරි පුහුණුවක් බවට පත්කිරීම සැමගේ අභිප්‍රාය වූහ.

බලඇණි පුහුණු කාල සීමාව තුළ ඒකක පාලන රාජකාරීන් සඳහා නිලධාරී හා සෙනින් 40 දෙනෙකු පමණක් කාර්යන්හි නියුතු වූ අතර, සෙසු සැවොම පුහුණුවීම් නිරත වීම.

බලඇණි පුහුණුවත් සමග නිනොනොවීම සාමාන්‍ය සිරිතක් වුවද එසේ කිසිවෙකු පුහුණු කාල සීමාව තුළදී නිනොනො නොවීමට සියලු දෙනාම දිරිමත් කිරීම හා අරමුණ අර්ථ ගැන්වීම.



පුහුණු කාලය තුළදී ඒකක නිලධාරී හා සෙනින්ගේ සියලු පාලන ගැටලු හඳුනා ගැනීමට අවශ්‍ය විවිධ ක්‍රම සැලසීම මගින් ගැටලු හඳුනා ගැනීම හා ඔවුන්ගේ පාලන ගැටලු ක්‍රමානුකූලව නිරාකරණය කිරීමට කටයුතු සැලසීම

ප්‍රායෝගික පුහුණුව අර්ථ ගැන්වීම සඳහා මාදුරුඔය පුහුණු පාසලට ගමන් කරන අතරතුරදී ඒකක සියලුම පිරිස් ඓතිහාසික පොලොන්නරු පුරයට රැගෙන යාම හා එහි ඓතිහාසිකත්වය පිළිබඳ ප්‍රවීනයෙකුගෙන් පැහැදිලි කිරීම.

22 වන සේනාංක මූලස්ථානයට අයත් බලඇණියක් ප්‍රථම වරට ප්‍රායෝගික Lane firing, Bunker Blasting, Live Firing Movement, Intensive Firing යන සියල්ල සිදු කිරීම මගින් ආත්ම විශ්වාසය ඉහළ නැංවීම.

ආධ්‍යාත්මික ගුණ වගාවට මඟ පෙන්වීම. ඓතිහාසික ගිරිහඬු සෑරදුන් වෙනුවෙන් පූජෝපහාර පැවැත්වීම හා ඒකකය වෙත වැඩම කළ වූ ස්වාමීන් වහන්සේලා මගින් ධර්මාවබෝධය ලබාදීම හා ආගමානුකූල වත් පිළිවෙත් සිදු කිරීම.

මෙසේ තිර අදිටනින් යුතුව පුහුණුව සිදු කළ ඒකකය ප්‍රශස්ත මට්ටමින් පුහුණුව නිම කරන ලද බලඇණියක් වශයෙන් සේනාංකාධිපති ඇගයීමට ලක්වීම ඒකකයටත් සමස්ත වශයෙන් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවක් ලත් අභිමානයක් වශයෙන් අප මෙහිදී ගෞරවයෙන් යුතුව සිහිපත් කරන්නෙමු.

**බුද්ධි අංශය 15 ශ්‍රීලපාහ**





**26 පිටුවෙන් ... කාලයේ පහර කෑ .......**


කියලා බුදු දහමේ කියවෙන්නේ නැහැ. අලුත් විලාසිතා, දුවද විලවුන් ආලේපන භාවිතා කරන්නට එපා කියා අදහසක් එයින් ගෙන දෙන්නෙත් නැහැ. ලස්සනට නැතිව කැතටයි ඉන්න ඕනී කියලා සෘණාත්මක සංකල්පයක් බුදු දහමේ නැහැ.

ජීවිතය යනු තාවකාලික නවාතැන්පලකි. ඉපදී, මියදී නැවතත් එම ක්‍රියාවලියම නොකඩවා සිදු වන්නෙකි. මෙයින් මිදීමට ඇති එකම මඟ නිවන් මඟ පමණක්මය. එය විවර කර ගැනීම වස්, මේ එළ කරන ලද ලිපිය ඔබ හට යම්තාක් දුරට හෝ ඇස් වැසිල්ලක් වේවා.

මෙම අදහස් පාඨක ඔබ වෙත ගෙන ඒම සඳහා 'මහා මේඝ' මාසික පුවත් සඟරාව උපයෝගී කරගෙන ඒ ඇසුරින් නිර්මාණය කරන ලදී.

බනි II ප්‍රේමසේන ඩීඑම්පීඑස් - 4 ශ්‍රීලපාහ





# 1 ශ්‍රීලපාහ පුවත්

## 63 වන සංවත්සරය

ශ්‍රී ලංකා යුද හමුදාවේ පුරෝගාමී බළඇණියක් 1 ශ්‍රීලපාහ ඒකකය දශක තුනක මිලේච්ඡ යුද්ධය මුලිණුපුටා දැමීමට සක්‍රියව දායකත්වය දෙමින් මානුෂීය මෙහෙයුමෙන් පසු 53 සේනාංකය යටතේ පනාගොඩ කඳවුරේ ස්ථානගතව දැනට අති විශේෂ ප්‍රභූ ආරක්‍ෂක රාජකාරියෙහි යෙදී සිටී.

පුරා වසර 63 ක අභිමානවත් ඉතිහාසයෙන් පැවත එන චාරිත්‍ර හා සම්ප්‍රදායන් වෙත ප්‍රමුඛත්වය දෙමින් 1 ශ්‍රීලපාහ 63 වන ජන්ම දිනය සැමරීමට කටයුතු සූදානම් කරන ලදී. ඒ අනුව රොමියල් මාවතේ පිහිටි ශාඛ්‍යාරාම විහාරස්ථානයේ බෝධි පූජා පිංකමක් සිදුකර අණතුරුව කතරගම දේවාලයේ පවත්වනු ලබන පූජාව සහ කිරිවෙහෙරෙහි කිරිපිඩු දානමය පුණ්‍ය කර්මයද ඉටු කරනු ලැබූයේ 1983 ජූනි මස 23 වන දින ලුතිතන් වාස් ගුණවර්ධන ශ්‍රීලපාහ ඇතුලු සෙසුනිලයන් මේ දක්වා මව්බිමේ



ආරක්‍ෂාව සඳහා නිලධාරි 25 දෙනෙකු හා සෙසුනිල 503ක් තම දිවිය ජීවිත පූජා කළ රණවිරුවන් හට නිවන් සුව පතමින් හා ආබාධිත රණවිරුවන්ට හා දැනට සේවයේ නියුතු සියලු දෙනා වෙත ආශීර්වාද එක්කරමින්ය.

2013 මැයි 12 වන දින ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩීඑල්යු තාබ්‍ෂ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ වෙත පනාගොඩ කඳවුරේදී සම්මාන මුරයක් හා වර්ණ ධජ සහිත සම්මාන පෙළපාළියක් පිරිනමනු ලැබීය. බළඇණියේ කීර්තිනාමය නොකඩවා පවත්වා ගැනීම සඳහා දායක වූ නිලධාරින් සෙනීන් හට අණදෙන නිලධාරි විසින් තම ප්‍රසාදය පල කරමින් ඉදිරියටත් ඒකකයේ කීර්තිනාමය ආරක්‍ෂා කරමින් සේවය කිරීමට නව ධෛර්යයක් බළඇණියේ නිලධාරි සෙසුනිලයින් හට ලබාදෙන ලදී.

ප්‍රෞඪ ඉතිහාසයක් ඇති අප බළඇණිය 2012 වසරේ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ඒකක අතර පැවති හටකාර්ය සම්පාදනය, මලල ක්‍රීඩා, සරඹ, හොඳම ක්‍රීඩා බළඇණිය, හොඳම ප්‍රධාන ලිපිකරු වැනි කාර්යයන් වෙනුවෙන් ප්‍රථම හා දෙවන ස්ථාන හිමිකර ගනිමින් 2012 වසරේ හොඳම බළඇණිය ලෙසින් ශූරතාවය හිමිකර ගන්නා ලදී. මෙම ලබාගත් පන්නරය තුළින් 2013 වසරේ ද අනිකුත් ඒකකයන්ට අභියෝගයක් වෙමින් සියලුම දෙනාගේ කැපවීමෙන් නිරතුරුවම 'සේවය කරමි' ආදර්ශ පාඨය නොපිරිහෙලා ඉටු කරමින් රාජකාරි ඉටු කරනු ලබයි.

63 වන බළඇණි දිනය වෙනුවෙන් එදින සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් පවත්වා එදින රාත්‍රී රසල් හයින් ක්‍රීඩා පිටියේදී ජනප්‍රිය සංගීත කණ්ඩායමක් වන සිටික්‍රීක් සංගීතය සමගින් ගායක ගායිකාවන් පිරිවරා අති දැවැන්ත සංගීත රාත්‍රියක් පැවැත්වූහ. මෙම ප්‍රසංගයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් යුද හමුදා මාණ්ඩලික ප්‍රධානී හා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩි රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයූ පීඑස්සී සහභාගි විය. එම අවස්ථාවට රෙජිමේන්තු සේනාවිධායක, 533 බළසේනාධිපති, රෙම ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරින් රැසක් සහභාගී වූහ.

2013.05.18 දින රෙම ශ්‍රීලපාහ බනි/සැර නිවස්නයේ බළඇණියේ ජ්‍යෙකොනොනින්ගේ සාදයක් ඒකක අණදෙන නිලධාරි ගේ ප්‍රධානත්වයෙන් පැවැති අතර, 2013.05.19 දින නිලධාරි නිවස්නයේ ද රෙජිමේන්තු අධිපතිගේ ප්‍රධානත්වයෙන් සාදයක් පැවැත්වූහ. ඒ සඳහා ශ්‍රීලපාහ රෙජිමේන්තුවට අයත් ජ්‍යෙෂ්ඨ නිලධාරින් ඇතුළු තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරින් ද සහභාගි වූහ.

**බුද්ධි අංශය - 1 ශ්‍රීලපාහ**







# 7 ශ්‍රීලපාහ පුවත්

## ජීවිතයක් බේරා ගැනීමට උරදුන් විරුවන්



අද උතුරු කරේ කිලිනොච්චි ප්‍රදේශයේ කිලිනොච්චිය නැමැති ඒ සොඳුරු භූමිය මීට වසර ගණනාවකට පෙර රුදුරු ගිණිදළුල්වලින් අඳුරු වූ කාල වකවානුවේ අඳුරු පැතිකඩ තුළින් පැයු පුන් සඳක් බඳු සීඩී පාක්‍යනාදන් උපතින් ලද හැකියාව සහ ගවේශණය කර සොයාගත් දැනුමෙන් සමාජයට මෙහෙවරක් කළ ගුරුවරයෙකි. තමා ලද දැනුම උපයෝගි කර ගනිමින් සමාජයට වැඩදායි පුරවැසියන් විද්වතුන් රැසක් බිහිකර ඒ අතර දිවයින පුරා ඉහළ පෙළ වැජඹෙන වෛද්‍යවරුන් ගුරුවරුන් හා නීතිඥයින්ද ඇත.

කෙසේ වෙතත් අවාසනාවකට ඔහු කොළඹ ජාතික රෝහලේ හෘද රෝගියෙකු ලෙස ප්‍රතිකාර ලබමින් සිටී. ඔහුගේ රෝගී තත්ත්වය උත්සන්න වීමත් සමඟ වෛද්‍යවරුන් ප්‍රකාශ කළේ ඔහුගේ රෝගය සුව කිරීමට හෘද සැත්කමකට භාජනය කළ යුතු බැවින් ඒ සඳහා රුධිරය අවශ්‍ය බවය. පාක්‍යනාදන් මහතා විසින් 7 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් අනිල් සෝමවීර හට දුරකථන ඇමතුමක් ලබාදී පත්ව සිටින අසරන තත්ත්වය පැහැදිලි කළේය. අසරණ අයට පිහිට වීම තරම් පිංකමක් තවත් කොහේද යන්න සිතේ දරාගෙන ඒකක අණදෙන



නිලධාරි විසින් කිලිනොච්චිය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජනරාල් උදය පෙරේරා දනුවත් කර ලැබූ උපදෙස් මත ඒකකය තුළ රාජකාරි කරනු ලබන භටපිරිස් මේ පිළිබඳව දැනුවත් කර උදාරතර කර්තව්‍ය වෙනුවෙන් සිය කැමැත්තෙන් රුධිරය පරිත්‍යාග කිරීමට කැමැති අයවලුන් පිරික්සන්නට විය.

තම රුධිරය හෙලා මච්බිම එක්සේසත් කිරීමට ඇපකැප වූ බව ගම්‍ය කරමින් සියලු දෙනා එක වරම නොපැකිලිව අත ඔසවා තම කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් පිළිබිඹු වන්නේ ඔවුන්ගේ උදාරතර මනුෂ්‍යත්වයයි. තමන්ගේ නායකත්වය සහ මග පෙන්වීම මත රාජකාරි කරනු ලබන සෙබළුන්ගේ හැඟුම්බර හදවත් පිළිබඳ සතුටට හා අභිමානයට පත් අණදෙන නිලධාරි ඒ අතුරින් නිලධාරින් දෙනෙකු සහ සෙබුනිලයින් දෙදෙනෙකු හට අවස්ථාව ලබා දී සීඩී පාක්‍යනාදන් මහතාගේ ජීවිතය බේරාග ැනීමේ ඒ උදාරතර කර්තව්‍යයට මුලිකත්වය ලබා දෙන ලදි.

සිංහල දමිල මුස්ලිම් ජාති භේදයකින් තොරව ඒ අඳුරු යුගයට තිත තබා සියල්ලම ලක් මැණියන්ගේ සෙවනේ එකම මිනිසුන් ලෙස ජීවත් වන්නට කාලය එළඹ ඇති බැව් මෙයින් නිදසුන් කර දක්වයි එපමණක් නොව සිංහල දමිල මුස්ලිම් සියල්ලන් එකම ලෙයින් බැඳුණු බවට මෙය කදිම නිදසුනකි. අද මෙන් හෙට දවසද අප ඔබ වෙනුවෙන් රුධිරය හෙලා හෝ කඳුළු පරදා සිනා හසරැල් මවන්නට ඇප කැප වෙන බැව් පවසන්නේ හදපිරි සතුටිනි.

**බුද්ධි අංශය 7 ශ්‍රීලපාහ**

# 11 ශ්‍රීලපාහ පුවත්

## ප්‍රජා සත්කාර





ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ දෙමළ ජනතාව අතර අන්‍යෝන්‍ය සබඳතාවය වර්ධන කිරීමෙහිලා දෙමළ ජනයාගේ ජීවන තත්ත්වය නඟාසිටුවීමට නන් අයුරින් ව්‍යාපෘති සිදු කරනු ලබයි. ඒ අනුව යාපනය දිස්ත්‍රික්කයේ කරෙයිනගර් ප්‍රදේශයේ ස්ථාන ගතව රාජකාරි කරනු ලබන 11 ශ්‍රීලපාහ ඒකකය විසින් සිදු කළ උදාර මෙහෙවර පිළිබඳව කෙටි සටහනක් මෙසේ තබන්නෙමු. ආසේමු(යා) ආඥාපතිගේ පූර්ණ සංකල්පයක් මත 51 සේනාංකාධිපතිගේ හා 513 බළසේනාධිපතිගේ මඟ පෙන්වීමෙන් ඒකක අණදෙන නිලධාරි නි/62252 ලුතිතන් කර්නල් ජේකේආර්පී ජයසිංහ අර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ඒකක දායකත්වයෙන් ජේ/44 කරෙයිනගර් දකුණ ග්‍රාමසේවා වසමේ පදිංචි යසෝදරා බාලසිංහම් හට නිවසක් ඉදිකර දෙන ලදී. එම නිවස ආසේමු(යා) ආඥාපති මේජර් ජෙනරාල් එම් හතුරුසිංහ ආර්එස්පී එන්ඩීසී අයිජී විසින් 2013.04.17 වන දින පෙරවරු 1005 පැයට සුබ මොහොතින් විවෘත කර භාරදෙන ලදී. රටේ සාමය ආරක්ෂා කිරීමට මෙන්ම හුදී ජනතාවගේ සුබ සිද්ධීන් වලට දිනෙන් දින ප්‍රජා මෙහෙවර සිදු කරන මෙම බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ බැබළෙන ඒකකය බවට පත්වේවා යැයි එක සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය 11 ශ්‍රීලපාහ**

# THE VIETNAM WAR (1954 - 1975)

YOs' Column

The Vietnam War was a long, costly armed conflict that pitted the communist regime of North Vietnam and its Southern Allies, known as the Viet Cong, against South Vietnam and its principal ally, the United States. The war began in 1954 (though conflict in the region stretched back to the mid 1940), after the rise to power of Ho Chi Minh and his communist Viet Minh party in North Vietnam and continued against the backdrop of an intense Cold War between two global superpowers, the United States and the Soviet Union.

More than 3 million people (including 58,000 Americans) were killed in the Vietnam War; more than half were Vietnamese civilians. By 1969, at the peak of more than 500,000 USA military personnel were involved in the Vietnam conflict. Growing opposition to the war in the United States led to bitter divisions among Americans, both before and after President Richard Nixon ordered the withdrawal of USA troops in 1973. In 1975, communist forces seized control of Saigon, ending the Vietnam War and the country was unified as the Socialist Republic of Vietnam in the following year.

Vietnam's intense nationalism was developed through centuries of resisting foreign interference. Nationalism and patriotism were probably the ultimate cause of the Vietnam War. As a kingdom in Southeast Asia, the Chinese constantly conquered Vietnam in the past.

European expansion provided a threat to Vietnamese independence. The Portuguese were the first Europeans to contact with the Vietnamese, the French followed 100 years after in 1615. French ultimately gained the control of the entire country by 1883.

## The Turning Point of Vietnam History

Meanwhile the Vietnamese Nationalist Party formed in 1927 with the middle and upper intellectuals. These people infiltrated native garrisons, but in February 1930, a major military plane was failed. The leaders were forced to exile into China. The Vietnamese Communist Party later renamed as the Indochina Communist party (ICP), led by Ho Chi Minh was the most successful party. The leader Ho Chi Minh omaged as the most revered leader in Vietnam.



Ho Chi Minh

In March 1945, the Japanese overthrew the French Government and established a collaborative Vietnamese government under Emperor Bao Dai. Afterwards, World War II came to an end and the Japanese had surrendered. With the collapsed French system and the Japanese surrendering, a vacuum of power was formed. The Vietminh saw this as their chance for their independence and so they organized the August Revolution On 2nd September 1945, having prevailed in much of the country, Ho Chi Minh called, before a half million crowd, for the recognition of the newly formed government called the Democratic Republic of Vietnam (DRV).

When Japanese surrendered after World War II, China and Great Britain occupied Northern and Southern Indochina until a stable government was restored. These troops combined with their government recognition of the French claim, joined forced with the French troops to fight off the DRV. After Saigon fell into the control of the French, South Vietminh launched a guerrilla war against French

USA began to send aids to South Vietnam encouraging economic development and urged social and political reforms. The Army of Republic of Vietnam (ARVN) was formed for the south and the People's Army of Vietnam (PAVN) was formed for the North. After that war between the two regimes had begun. The Vietnam War officially started in 1964 when North Vietnamese boats attacked the USA destroyer Maddox when it was on a mission to gather North Vietnamese intelligence. This incident is now known as the Gulf of Tonkin Incident, and resulted in the approval of the Gulf of Tonkin Resolution.

## Over View of Insurgent Tactics

By the mid 1960 most main force Viet Cong troops were armed with Chinese versions of the Russian AK-47 submachine gun. They also used a range of effective Soviet and Chinese light and medium machine guns and infrequently, heavy machine guns. In particular, heavy machine guns were valued for defense against American helicopters. Viet Cong had highly effective rocket propelled grenades and recoilless rifles for destroying armored vehicles or bunkers. Mortars were also available in large numbers and had the advantage of being very easy to transport.

Many weapons, including booby traps and mines, were homemade in villages. The materials ranged from scavenged tin can to discarded wire, but the most important ingredients were provided by the enemy. In a year, dud American bombs could leave more than 20,000 tons of explosives scattered around the Vietnamese countryside. Local forces also designed primitive weapons, some designed to frighten intruders, but others were extremely dangerous. Punji traps sharp spikes hidden in pits could easily disable an enemy soldier.

There would be more hit and run attacks and ambushes. To counter the American build up, Viet Cong recruitment would be stepped up and more North Vietnamese Army troops would be infiltrated into South Vietnam.

Hiding the base areas had always been a high priority for the Viet Cong. Now, with American spotter planes everywhere, it was more vital than ever to protect them. In remote swamps or forests, there were few problems, but nearer the capital, it was much more difficult. The answer was to build enormous systems of underground tunnels. Tunnels were not to be treated as mere shelters. There were complexes big and small scattered across the country. Each villager in a NLF area had to dig three feet of tunnel a day. There was even a standard handbook specifying how tunnels were to be built. The biggest tunnel systems were in the Iron Triangle and the Cu Chi District, only 20 miles away from Saigon. Any facility used by the insurgency a conference room or training area had almost immediate underground access. Hidden trapdoors led below, past guarded chambers, to long passages. At regular intervals, branches led back to the surface and other secret entrances. Some openings were even concealed beneath the waters of streams or canals.

At the deeper levels, there were chambers carved out for arms factories and a well for the bases water supply. There were store rooms for weapons and rice, and there was sometimes a hospital or forward aid station. Long communication tunnels connected the base with other distant complexes. Everywhere on the top level, there were tunnels leading upwards to hundreds of hidden firing posts for defense of the base.

On 30th January 1968, the real TET Offensive began. Early in the morning, North Vietnamese troops and Viet Cong forces attacked both towns and cities in South Vietnam, breaking the ceasefire that had been called for the Vietnamese holiday of TET (the Lunar New Year). The Communists attacked around 100 major cities and towns in South Vietnam. The size and ferocity of the attack surprised both

# THE VIETNAM WAR (1954 - 1975)



the Americans and the South Vietnamese, but they fought back. The Communists, who had hoped for an uprising from the populous in support of their actions, met heavy resistance instead.

In some towns and cities, the Communists were repelled quickly, within hours. In others, it took weeks of fighting. In Saigon, the Communists succeeded in occupying the USA embassy, once thought impregnable, for eight hours before they were overtaken by USA soldiers. It took about two weeks for USA troops and South Vietnamese forces to regain control of Saigon. It took them nearly a month to retake the city of Hue.

In March 1971 USA Army soldiers of "Charlie" Company of 1st Battalion, 20th Infantry Regiment, and 11th Brigade of the American Division massacred at least 400 and perhaps as many as 200 civilians in 1968 in the hamlet of My Lai in South Vietnam. This is known as famous Mai Lai massacre.

The USA had a highly professional military force. The USA did not try to conquer North Vietnam. Instead, American leaders hoped superior USA firepower would force the enemy to stop fighting. The USA relied mainly on the bombing of North Vietnam and search and destroys ground missions in South Vietnam to achieve its aim. The USA used giant B-52 bombers as well as smaller planes for the main air strikes against the Communists. American pilots used helicopters to seek out Viet Cong troops in the jungles and mountains. Helicopters also carried the wounded to hospitals and brought supplies to troops in the field. The use of air power in the Vietnam War would change the way wars were fought for the Twentieth century and beyond. New technological advances and more sophisticated weapons made the Vietnam War a testing ground for the USA military.



Richard Nixon

## THE RESULTS OF THE CAMPAIGN

About 58,000 American military personnel died in the war, and about 300,000 were wounded. South Vietnamese deaths topped 1 million. North Vietnamese losses ranged between 500,000 and 1 million. Countless numbers of civilians in North and South Vietnam also were killed.

The United States spent over US $ 150 billion on the war. The USA bombing in the conflict was about four times greater than the combined USA British bombing of Germany in World War II. The American air strikes destroyed much of North Vietnams industrial and transportation systems. But South Vietnam, where most of the fighting took place, suffered the most damage. The war made refugees of up to 10 million South Vietnamese, or about half the country population. The bombing and the use of chemicals in order to clear forests scarred the landscape and may have permanently damaged much of South Vietnams cropland and plant and animal life.

North Vietnam helped establish Communist governments in Laos and Cambodia in 1975. In 1976, it officially united North and South Vietnam into the single nation of Vietnam. North Vietnam also forced its culture and political system on the people of the south. The North Vietnamese imprisoned hundreds of thousands of South Vietnamese. About 1.5 million Vietnamese fled Vietnam between 1975 and the early 1990. The Vietnam War had far-reaching effects in the United States. It was the first foreign war in which USA. Combat forces failed to achieve their goals. This hurt the pride of many Americans and left bitter and painful memories.

## Reasons for USA failures in Vietnam

a. USA underestimated the tenacity and organization of the North Vietnamese National Liberation Front and could not able to identify their tactics and techniques of fighting in jungle terrain.USA could not adjust their tactics this allows to apply attrition theory.

b. Despite dropping more tonnage of high explosive of Vietnam than the whole of World War 2 the Americans could not stop the movement of troops or supplies to the south along the Ho Chi Minh Trail.

c. The North Vietnamese conducted a "people's war" in which everyone played a part, this gain popular support from both South and North Vietnam in contrary to the USA.

d. At first, most Americans supported the war. But by 1970, the peace Movement had support from all parts of society and no government could ignore it.

e. After 1969, there were deep questions about the efficiency of US troops. There was a serious drug problem; desertion rates were high and morale low. Many troops were "time-servers," i.e., counted the dates until the tour was over.

f. The US never really understood the culture of the Vietnamese people. Coca Cola, chewing gum, ball point pens, and ice cream cones could not dislodge their ancient beliefs.

g. America was not prepared to keep losing high numbers of casualties for such limited progress in a difficult jungle war, for which they were not suited.

h. The strength and resourcefulness of the NLF. For example, the highly complex Cu Chi tunnel system the US never shut down.

i. USA neglected factor of winning the hearts and minds of the Vietnamese people and thereby unable to keep up popular support for the war in both front USA and Vietnam.

j. US troops did not have any experience of fighting with insurgency after WW II thus unable to change their tactics, terrain and troops for counter insurgency operations.

The Vietnam War greatly changed USA forever. It was the longest war fought in American history, lasting from 1955 to 1973. The Vietnam War tarnished USA self image by becoming the first time in history falling the USA to accomplish its stated war aims, to preserve a separate, independent, noncommunist government. The war also had great effects on the American people. One of the chief effects of the war was the division it caused among the people. Not since the Civil War had USA been so divided. This war would have lasting effects on the USA.

The reality was that the Vietnam was not about two separate countries for the Vietnamese, this was a war about one country with two warring factions, and the weaker of those two had essentially been created and certainly bolstered by the USA. The aim of the American war campaign to grind down the insurgent until the Communists in the North agreed to abandon their bid for control of the South was impossible.

By the time the USA realized that the war was utterly unwinnable, it was already too late. In 1973, when President Richard Nixon withdrew the last USA ground troops, nearly 60,000 Americans were dead, thousands more suffered from the physical and psychological repercussions of the brutal warfare in the jungles of Vietnam, and the American people had learned to distrust their leaders and to question their nation's essential values.

In 1975, South Vietnamese government forces surrendered to the NLF and the North Vietnamese Army. Vietnam was at last, united and united under a Communist government. The USA had officially failed to achieve its objectives. A nation familiar to grand victories suffered its first major defeat; the "longest war" was a military, political and social disaster, one that would haunt Americans for decades.

# 15 ශ්‍රීලපාහ පුවත්

## නව අණදෙන නිලධාරී



වර්ෂ 2013 ක්වූ මැයි මස 16 වන දින ඒකකයට සුවිශේෂ දිනයක් විය. එනම් ලුතිතන් කර්නල් එන්ජීකේ ගුණසේන ශ්‍රීලපාහ විසින් 15 ශ්‍රීලපාහ ඒකකයේ හතර වන නියමුවා වශයෙන් සිය ධුරයේ රාජකාරි භාරගැනීම සනිටුහන් වීමයි. නව අණදෙන නිලධාරී වෙත පිරිනමන ලද කඳවුරු සම්මාන මුරයෙන් පසුව සම්ප්‍රදානුකූලව පොල්තෙල් පහන දල්වා 0819 පැයට එළඹි සුබ මොහොතේදී සෙත් පිරිත් සජ්ඣායන මධ්‍යයේ නව තනතුරෙහි රාජකාරි භාර ගන්නා ලදී.



තම රාජකාරි භාර ගැනීමෙන් පසු ඒකක භූමියේ අඹ පැලයක් රෝපනය කිරීමෙන් අනතුරුව ඒකක යේ නිලධාරී හා සෙබුනිලයින් අමතා හරවත් දේශනයක් සිදු කරන ලදී. එහිදී ඒකකය සමඟින් රාජකාරි කිරීමේදී මාතෘ භූමියේ ඒකීයභාවය වෙනුවෙන් ජීවිත පුජාකළ හා තුවාල ලැබූ උදාරතර වීරෝදාර නිලධාරීන් හා සෙබුනිලයින්ගේ විශිෂ්ට සේවය අගය කිරීමට ද අමතක කළේ නැත. 23 වසරකට ආසන්න කාලයක් පුරා දිවයිනේ උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි ක්‍රියාත්මක රාජකාරි වල නියැලී රාජකාරි ඉටු කරමින් විවිධ තනතුරු හොබවමින් සිය නායකත්වය මැනවින් පිළිබිඹු කර ඇති මෙම ජ්‍යෂ්ඨ නිලධාරී ලබා ඇති පරිනත භාවය උපයෝගී කරගෙන 15 ශ්‍රීලපාහ නාමය පාබල හමුදා රෙජිමේන්තුව තුළ ද 22 වන සේනාංක බලප්‍රදේශය තුළද දිදුලන ඒකකයක් බවට පත්කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය හා ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ලැබේවායි ප්‍රාර්ථනය කරන්නෙමු.

**බුද්ධි අංශය - 15 ශ්‍රීලපාහ**





# රෙම ශ්‍රීලපාහ පුවත්

## නවතම්යෙන් නිලධාරී ඉදිරි සැලසුම් අංශය ස්ථාපනය කරයි.

සංශෝධනය කරන ලද නව රෙජිමේන්තු සංස්ථාවට අනුව **"නිලධාරී ඉදිරි සැලසුම් අංශය"** 2013 පෙබරවාරි මස 14 දින ස්ථාපනය කරනු ලැබීය.

රෙජි අධිපති ගේ අවශ්‍යතා මත සේනාවිධායක හා රෙජිමේන්තු මාණ්ඩලික ප්‍රධානී ගේ පූර්ණ අධීක්ෂණයෙන් මෙම අංශයේ කටයුතු සිදු කරනු ලබන අතර, එහි ප්‍රථම අංශභාර නිලධාරී ලෙසින් නි/64876 මේජර් කේපීසී ධර්මසිරි පීඑස්සී ශ්‍රීලපාහ කටයුතු කරනු ලබයි.

මෙම අංශය ස්ථාපිත කිරීමට ප්‍රථම රෙජිමේන්තු **'ප්‍ර' ශාකාව** වෙතින් ඉටු කරනු ලැබූ නිලධාරීන්ගේ ඉදිරි සැලසුම් කටයුතු මෙම අංශයේ කටයුතු ආරම්භ කිරීමත් සමඟ ඉතා කාර්යක්ෂමව හා ක්‍රමවත්ව සිදු කිරීමට හැකියාව ලැබී ඇත.



**නිලධාරී ඉදිරි සැලසුම් අංශය ශ්‍රීලපාහ**

# මාණ්ඩලික පාඨමාලාවේ පෙර පුහුණුව



ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය වෙතින් පවත්වනු ලබන මාණ්ඩලික පාඨමාලාව - 2014 සඳහා වැඩි නිලධාරීන් සංඛ්‍යාවක් ශ්‍රීලපාහ රෙජිමේන්තුව වෙතින් සහභාගි කරවීමට රෙජිමේන්තු අධිපතිගේ සංකල්පයක් අනුව පෙර පුහුණුවීම් පාඨමාලාවක් සැලසුම් කර ඇත. මෙම පාඨමාලාව රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක හා රෙජිමේන්තු මාණ්ඩලික ප්‍රධානින් ගේ පූර්ණ අධීක්ෂණයෙන් ඒ සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් වෙනුවෙන් සකස්කර පවත්වාගෙනු යනු ලබයි. පාඨමාලාභාර නිලධාරී වශයෙන් 1 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී පත්කර ඇති අතර, ඔයුගේ සම්බන්ධීකරණය යටතේ යුද හමුදා සහ සිවිල් උපදේශකයන්ගෙන් සැදුම්ලත් උපදේශක මණ්ඩලයක් මඟින් දේශන පවත් වනු ලබයි.



පෙර පුහුණුවීම් පාඨමාලාව 2013 මැයි මස 03 වන දින රෙජිමේන්තු අධිපතිගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කළ අතර, මාස තුනක කාල සීමාවක් තුළදී සිදු කිරීමට කටයුතු කර ඇත. මෙහිදී



රෙජිමේන්තු අධිපති විසින් සිදු කළ දේශනයේදී මාණ්ඩලික පාඨමාලාව හැදෑරීමේ ඇති වැදගත් කම අවබෝධ කර දුන් අතර, යුද හමුදා නිලධාරියකු වශයෙන් ඉදිරියේදී මෙම පාඨමාලාව සමත් වීම අනිවාර්යය සුදුසුකමක් බව පෙන්වා දෙන ලදී.



පෙර පුහුණුවීම් පාඨමාලාවේ එක් ප්‍රධාන අධියරක් වශයෙන් යුද්ධෝපාය ප්‍රායෝගික පරීක්ෂණයට සූදානමක් ලෙස අධ්‍යන වැඩ මුළුවක් යුද හමුදා විද්‍යා පීඨයේ නිලධාරී අධ්‍යන අංශය සමඟ සම්බන්තාවයෙන් 2013 ජුනි මස 03 දින සිට 2013 ජුනි මස 07 දින දක්වා පවත්වන ලදී. වැඩ මුලුව අවසානයේ රෙජිමේන්තු අධිපතිගේ ප්‍රදානත්වයෙන් ශ්‍රීලපාහ නිලධාරීන් සමඟ සන්ධ්‍යා හමුවක් පැවත් වූහ. එහිදීද වත්මන් තත්ත්වය තුළ නිලධාරීන්ගේ කාර්යය භාර්යය මැයෙන් දේශනයක් පවත්වනු ලැබීය.



# සුබ මොහොතින් නව තනතුරට පත් වූ ඔබට රෙජිමේන්තු අධිපති ඇතුළු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම්...!



24 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි නි/63030 මේජර් එස්එම්එන්ජී අරබේපොල ශ්‍රීලපාහ



26 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි නි/62607 මේජර් ජීඩීකේජී ගනේගොඩ ශ්‍රීලපාහ



24 ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි නි/64049 මේජර් ආර්ඒ සමරනායක ශ්‍රීලපාහ



11 ශ්‍රීලපාහ බුද්ධි නිලධාරි නි/667950 ලුතිතන් පීඩී විජේරත්න ශ්‍රීලපාහ



12 ශ්‍රීලපාහ බුද්ධි නිලධාරි නි/68030 ලුතිතන් එස්පි විජේසේකරආරච්චි ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ රෙජිමේන්තු සැරයන් මේජර් සෙ/305216 බනි 1 ඩීඑම්එල් හේරත් (ආර්එස්පී යූඑස්පී)



1 ශ්‍රීලපාහ රෙජිමේන්තු සැරයන් මේජර් සෙ/303644 බනි 1 බීජී ජයරත්න බණ්ඩාර



රෙම ශ්‍රීලපාහ සරඹ උපදේශක සෙ/9ඩී00523 බනි 11 සුමනදාස වයිඑම්



15 ශ්‍රීලපාහ ප්‍රධාන ලිපිකරු සෙ/307518 බනි 11 වන්නිනායක ඩබ්ලිව්හම්පීඑස්



15 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී නි/61788 ලුතිතන් කර්නල් එන්ජීකේ ගුණසේන ශ්‍රීලපාහ



රේම ශ්‍රීලපාහ මානි 1 (පාලන) නි/61688 ලුතිතන් කර්නල් ඩීජීකේ දිසානායක ආර්එස්පී ශ්‍රීලපාහ



රේම ශ්‍රීලපාහ මානි 11 (පාලන) නි/63284 මේජර් ඒපීඑල් සෙනවිරත්න ශ්‍රීලපාහ



1 ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරී නි/64016 මේජර් කේඑම්එම්කේබී කඩවතමුදලි ශ්‍රීලපාහ



රේම ශ්‍රීලපාහ නිලධාරී ඉදිරි සැලසුම් අංගභාර නිලධාරී නි/64876 මේජර් කේපීසී ධර්මසිරි පීඑස්සී ශ්‍රීලපාහ



11 ශ්‍රීලපාහ රෙජිමේන්තු සැරයන් මේජර් සෙ/302360 බනි 1 එල්ජී සරත්



රේම ශ්‍රීලපාහ උපකරන පාලන සැරයන් මේජර් සෙ/303659 බනි 1 කේජීපී කමලරත්න



රේම ශ්‍රීලපාහ ප්‍රධාන ලිපිකරු සෙ/303794 බනි 1 ඩීඑම් විකුමාදර



11 ශ්‍රීලපාහ ප්‍රධාන ලිපිකරු සෙ/309911 බනි 11 බණ්ඩාර එච්එම්අයිපී



12 ශ්‍රීලපාහ සරඹ උපදේශක සෙ/304160 වර්ණ සැරයන් ගාමිණි කේඑම්කේ



11 ශ්‍රීලපාහ සරඹ උපදේශක සෙ/308295 වර්ණ සැරයන් ප්‍රියන්ත ඩී

# 12 ශ්‍රීලපාහ පුවත්

## කෙළිබිමේ ශූරයෝ

වසර 5 ක අතීතයකට හිමිකම් කියන 12 ශ්‍රීලපාහ පාබල විරුවන් යුදමය දස්කම් පෑ ආකාරය මුළු යුද්ධ හමුදාවටම රහසක් නොවේ. එවන් දස්කම් පෑ විරුවන් අද තම දක්ෂතා ඉතා උසස් ආකාරයෙන් ක්‍රීඩා භූමියේදී දක්වීම සැබැවින්ම සටහන් තබන්නේ මහත් වූ ආඩම්බරයෙනි. එදා අවි අත දරූ රණවිරුවන් ක්‍රීඩා භූමියට ගොස් 12 ශ්‍රීලපාහ ඒකකය ලක් අඹරේ ක්‍රීඩා තරුවක් කිරීම සඳහා මෙම ඒකක විරුවන් දෙදෙනකුගේ විස්කම් මෙම සඟරාවෙහි සනිටුහන් තබන්නේ අප ඒකකයෙහි විශිෂ්ටත්වය කියාපාමිනි.


12 ශ්‍රීලපාහ ඒකක ක්‍රීඩා තරුව සෙ/319419 කෝප්‍රල් ගල්කොටුව ජීජීටී කිලෝ ග්‍රෑම් 64 (ලයිට් වෙට්) බොක්සින් තරඟයන් වලදී ලද ජයග්‍රහනයන් මෙසේ සනිටුහන් කරන්නෙමු.

2010 අන්තර් ඒකක බොක්සින් තරඟාවලිය
රිදී පදක්කම් 01 යි
2011 ශ්‍රී ලංකා ආධුණික බොක්සින් තරඟාවලිය
රන් පදක්කම් 01 යි
2011 ඉන්ටර් මීඩියෙට් බොක්සින් තරඟාවලිය
රිදී පදක්කම් 01 යි
2011 ජාතික ශූරතා බොක්සින් තරඟාවලිය
ලෝකඩ පදක්කම් 01 යි
2012 ඉන්ටර් මීඩියෙට් බොක්සින් තරඟාවලිය
රන් පදක්කම් 01 යි
2012 ක්ලිප්පර් කුසලාන බොක්සින් තරඟාවලිය
ලෝකඩ පදක්කම් 01 යි
2013 යුද හමුදා ශූරතා තරඟාවලිය
රන් පදක්කම් 01 යි

ඔහුගේ මෙම දස්කම් ඒකකයේහි ගෞරවය මෙසේ ඔසවා තැබූ අතර, 2013 අප්‍රේල් මස 09 වන දින සිට 13 දක්වා ඉන්දියානු යුද හමුදා කණ්ඩායම සහ ශ්‍රී ලංකා යුද හමුදා කණ්ඩායම අතර ඉන්දියාවේ බැංගලෝර් හිදී පැවැත්වූ බොක්සින් තරඟාවලියක් සඳහා ද සහභාගී වී ඇත. එම තරඟාවලියේ දෙවන ස්ථානය ලබාගනිමින් රිදී පදක්කමකින්ද පිදුම් ලබා ඇත.

එමෙන්ම 12 ශ්‍රීලපාහ ඒකකයෙන් බිහි වූ තවත් ක්‍රීඩා තරුවක් ලෙසින් දක්ෂකම් දක්වා ඇති සෙ/324978 සාසෙ නිලන්ත කුමාර ඩබ්කේ සහභාගී වූ ජාත්‍යන්තර තරඟාවලියක දස්කම් දක්වා ද ඇත. රටවල් ගණනාවක සහභාගිත්වයෙන් පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ පැවති ජාත්‍යන්තර **ෂොතෝකාන් කරාතේ සංගමය** විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර එස්කේජ් කරාතේ කුසලාන 2013 හිදී රන් පදක්කම් 01 හා ලෝකඩ පදක්කම් 01 ලබාගනිමින් මෙම ඒකකයට කීර්තියක් ගෙනදී ඇත.

මෙසේ දක්ෂතා දක්වා ඇති මෙම ක්‍රීඩා විරුවන් හට අප බලඇණියේ සියලුම නිලයන්ගේ තුති පුදකරන්නේ මහත් වූ ආඩම්බරයෙනි.

බුද්ධි අංශය - 12 ශ්‍රීලපාහ

## නුඹ මගේද හැමදාම

මගේ පුංචි හිත ගාව
හැංගී මට පෑව
නුඹේ ආදරය
මට නේද හැමදාම ...

ඇවිත් අර ඈත සිට
නැවතිලා සිත ගාව
හැමදාම හිඳින්නට
අපි පෙරුම් පිරුවේ ...

ඇස් පියන් නොගසාම
බලන් ඉන්නම් හෙටත්
කියන්නකො ළඟින් හිඳ
නුඹ මගේද හැමදාම ...

අතින් අත අල්ලාන
පැතුම් පොදි තුරුළු කරන්
සඳහටම මගෙ වෙන්න
නුඹ එන්නෙ කවදාද ...

ජීවත් වෙන තුරාවට
දුක සතුට විඳ දරාන
මියෙන තුරු ළඟින් ඉන්න
මගේ වෙන්නෙ කවදාද ...

**7 ශ්‍රීලපාහ ලාකෝ රාජපක්ෂ ජීඑස් ගේ**
**පෙම්වතිය ආර්ඩබ්ලිව් නයෝමි ගංගා**

## නිර්මල රමණීය පුදබිම

**ඉපදුන රටට ආදරයක් ඇති නින්දා**
**ආවා යුද බිමට රට රැකුමට පෙරදා**
**අම්මේ අපි අපේ යුතුකම ඉටුකෙරුවා**
**අම්මා දුන්න මව් කිරිවල බල පෙන්නා**

**සෙ/328892 සාසෙ මධුශංක කේඑම්එස්**
**ආධාරක කණ්ඩායම - 19 ශ්‍රීලපාහ**




## ප්‍රියාවිය මාගේ

කලස සිට බැඳුනු පෙම මා ඔබ ගැන
යහළුවන් සමග ඔබ යන විට පන්තියට
ඉගි බිගි පා සෙනෙහසින් සිනාසී ගියේ
මගේ හදවතේ රැඳුනේ
ඔබ පමණයි ප්‍රියාවියේ...
නොසිතූ ලෙස බැඳුනි මා යුධ හමුදාවට
යුධ පිටියේ දී නොසිතූ ලෙස
මගේ දෙනෙත් අහිමි විය
රුදුරු බිම් වෙඩිය මා අන්ධ කළේ මන්ද
මා කළ පාපය කුමක් ද මා නොදනිමි
මට අද ඔබේ රුව දැක ගන්නට බැරිය
ඔබ අද වෙනෙකෙකුගේ
අතගෙන ගියේ ඇයි ද?
මගේ දෑස් අන්ධ වූවාට මගේ සිතේ ඇති
ඔබට බැඳි ආදරයත් අන්ද කලේ ඇයි ප්‍රියේ
මා ඔබට කිසිදින වෛර නොකරමි ප්‍රියේ
මන්ද යත් මා ඔබට තවම ලෙංගතුය
ඔබ අන්සතු වුවත් මා අන්සතු නැත
ඔබ වෙනුවෙන් මා හුදෙකලාවෙන්
සැමදා සිටිමි ප්‍රියේ

**2/ලුතිතන් එච්ආර්එන් සංජීව ශ්‍රීලපාහ**
**4 ශ්‍රීලපාහ**

# 15 ශ්‍රීලපාහ පුවත්

## තිස්සපුර අග්බෝපුර විහාරස්ථානයට අටවිසි



### බෝධි ප්‍රාකාරයක් හා ධර්ම ශාලාවක්

තිලෝගුරු සම්මා සම්බුදුරජානන් වහන්සේගේ උතුම් නෙමගුල සැමරීමට පිළිවෙතින් පෙළ ගැසුණු 15 ශ්‍රීලපාහ අයවලුන් තඹලගමුව ප්‍රදේශයේ මුස්ලිම් ගම්මාන කිහිපයකට මැදිව පිහිටි තිස්සපුර අග්බොපුර විහාරස්ථානයේ අඩුපාඩුවක්ව පැවැති අටවිසි බෝධි ප්‍රාකාරයක් හා ධර්ම ශාලාවක් ඉදි කිරීම වර්ෂය ආරම්භයේ මුල පුරන ලදී.



තිස් වසරකට ආසන්න කාලයක් පුරා පැවැති යුද්ධයේ අඳුරු සෙවනැලි හා නොයෙකුත් හේතූන් නිසා වසර 40 කට පමණ පෙර ධර්ම ශාලාවක් ඉදි කිරීම් කටයුතු අතරමඟ නවතා තිබූ ධර්ම ශාලාව හා අටවිසි බෝධි ප්‍රාකාරයක් 2013 වෙසක් පුර පසළොස්වක පොහෝ දින 15 ශ්‍රීලපාහ සියලුම අයවලුන්ගේ පූර්ණ දායකත්වයෙන් ඉදි කර පූජා කළහ.

ප්‍රදේශයේ බෞද්ධයින් සඳහා අඩුපාඩුවක්ව පැවැති ධර්ම ශාලාව හා බෝධි ප්‍රාකාරය පූජා කිරීම උත්සව සිරියක් ගනු ලැබිණි. ප්‍රථමයෙන් ආගමික වතාවත්වල යෙදී බුදු සසුන අටවිසි බුද්ධ ප්‍රතිමාවන් වහන්සේලා තැන්පත් කිරීම 224 බළසේනාධිපති කර්නල් එච්එල්වීඑම් ලියනගේ සහ ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එන්ජීකේ ගුණසේන ශ්‍රීලපාහ ඇතුලු පුණ්‍ය කටයුත්තට සහභාගි වූ සියලු දෙනාගේ සහභාගිත්වයෙන් සිදු විය. බුද්ධ ප්‍රතිමා පූජා කරන ලද මේජර් ඩීඑන් පණ්ඩිත ශ්‍රීලපාහ ද මෙම පුණ්‍ය කර්මයට දායක වීම විහාරාධිපති තිස්සපුර විමලවංශ හිමියන් විසින් සිහිපත් කරන ලදී.

**බුද්ධි අංශය - 15 ශ්‍රීලපාහ**





# ශ්‍රී ලංකාවේ වැඩිහිටි නිවාස

2010 වසරේ ඔප්පු කර ගත හැකිවී ඇත්තේ ශ්‍රී ලංකාවේ **ඩිමෙන්ෂියා** රෝගයෙන් පෙළෙන වැඩිහිටියන් සංඛ්‍යාව 13% ක් බවය. 2025 වන විට 25% ක් දක්වා ඉහළ යනු ඇතැයි විශ්ලේෂකයන් පෙන්වා දී ඇත. ,මෙහි පෙනෙන දෙයට වඩා නොපෙනෙන දෙය වැඩිය, වැඩිහිටි නිවාස වල නොදකින දේ බොහෝ ය.

එවකට සිටි පාලකයින් මෙවැනි වැඩිහිටි නිවාස පිහිටුවනු ලැබුවේ යහපත් චේතනාවන් පෙරදැරි කරගෙනය. එහිදී නියමයන් යෙදුයේ ,අසරණයන්ට පිහිට වෙමු, එය අද සල්ලි උපයන මාර්ගයක් වී ඇත.

| පළාත | නිවාස සංඛ්‍යාව | වැඩිහිටියන් සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර පළාත | 42 | 1828 |
| මධ්‍යම පළාත | 16 | 850 |
| දකුණු පළාත | 36 | 960 |
| උතුරු පළාත | 09 | 921 |
| නැගෙනහිර පළාත | 06 | 154 |
| වයඹ පළාත | 25 | 645 |
| උතුරු මැද පළාත | 02 | 251 |
| ඌව පළාත | 06 | 500 |
| සබරගමු පළාත | 10 | 800 |
| එකතුව | 152 | 6909 |

නමුත් මදක් සිතන්න ආදරය, සෙනෙහස, කඳුළ දහදිය සහ ශ්‍රමය හරිහම්බ කළ මුදල් දැනේ සවිය ශරීර ජවය දිවි හිමියෙන් කැප කළ පරම්පරාවක් ගොඩනැගූ වැඩිහිටියන්ට සළකන අපට සංස්කෘතික වටපිටාවක් තුළ දිනයක් අවශ්‍ය වන්නේ ද ?. ඔවුන් පෝෂණය කිරීමට රැකවරණය ලබාදීමට, ආරක්ෂාව සළසාදීමට, සුඛසාධනය ලබාදීමට වෙනම නිවාස රටට අවශ්‍ය ද .?

ආදරණීය මවුවරුණි, පියවරුණි, සෙනෙහෙබර දුරුවනි, අක්කේ, නංගියේ, මල්ලියේ ඔබට වැරදුන තැන කොතන ද .? දන්වත් හැරී බලනු.

( පොත පත ඇසුරෙන් )

**සෙ/304875 ලාංකෝ ජයරත්න ජීජීජී**
**බී කණ්ඩායම - 7 ශ්‍රීලපාහ**

# 9 (සෙව්) ශ්‍රීලපාහ පුවත්

## පවුල් පිටින් අවුරුදු නැගම් ආ සිවිල් වැසියන්



දශක 03 ක් පැවති කුරිරු යුද්ධය නිමාවත් සමගම අනුරාධපුර, මුලතිව්, ත්‍රිකුණාමලය සහ වව්නියාව වැනි දිස්ත්‍රික්ක 04 ටම මැදිවූ වැලිඔය ප්‍රාදේශීය සභාවට අයත් ගජබාපුර, ඇතාවැටුනවැව සහ මොණරවැව නැවත පදිංචි කරනු ලැබූ සිවිල් වැසියන් 2013.04.15 වැනි දින අපූරු අලුත් අවුරුදු චාරිත්‍රයක් සිදු කරනු ලැබූහ.

එනම් ත්‍රස්තවාදීන්ගේ පීඩාවන්ට ලක්වෙමින් තම ගම්බිම් අතහැරදාම වෙනත් ස්ථානවල පදිංචිව සිටි මෙම අහිංසක සිවිල් වැසියන් මානුෂික මෙහෙයුම නිමාවත් සමගම යුද හමුදාව තුළ තිබූ විශ්වාසභාවය තහවුරු කරගනිමින් නැවත තම ගම්බිම් වල පදිංචිව සිටුනු ලබයි. ඔවුනට නිරතුරුවම ආරක්ෂාව සපයන දුකේදී සැපේදී සොයා බලන 9(සෙව්) ශ්‍රීලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී ඇතුලු සියලුම දෙනා හට කෘත ගුණ සැලකීම වස් අවුරුදු නැගම් පැමිණියහ. ඔවුන්ගේ දුක් මහන්සියෙන් හරි හම්බකර ගත් ධනය වැය නැගම් පැමිණිය ඔවුන් හට ඒකක අණදෙන නිලධාරී ඇතුලු සියලුම දෙනා විසින් රස කැවිලි හා තේ පැන් සංග්‍රහයක් ද ලබාදී සිවිල් අයවලුන් අතර පවතින බැදීම තව තවත් තහවුරු කළහ.

**බුද්ධි අංශය 9(සෙව්) ශ්‍රීලපාහ**







# සොඳුරිය මියෙග දුර් ඈතයි

දගස් ගව් දුර සිටියත් ඔබ දුර ඈත
දකිනට වරම් නැත කිසිදා හැබෑහින්ම
නිවාඩු ලද විගස සොයුරන් යයි සොඳුරි බලා
මා හට නැත ඒ වරම
මගේ සොඳුරිය දුරු රටක නිසා

දින සති ගෙවී යන තුරු මා ඉන්නෙ
තව කොපමණ කල් යයි ද සිත ළතැවෙන්නෙ
කරකැවියන් ඔරලෝසුව නුඹෙ කටු විගසින්නෙ
බැහැ කල් දමන්නට දකිනට
සොඳුරියගේ රුපේ

තරු තනියැයි තරු අහසටම කියයි
නුඹ තනිවෙලා යැයි ඔබ මට නිතර කියයි
මා තනි වෙලා යැයි මා ඔබ හටම කියයි
මේ තනිකම නැතිවෙන්නයි
අපි හදවත් පතයි

දිදුලන දෙනෙත් දැකුමෙන්
මගේ නෙතු පිනා ගියා
ඒ හා!ඩ ඇසීමෙන් මා දෙසවන් මත්ව ගියා
ගුවනින් විදින මතකයන් හදවතේ තියා
ඉන්නම් මතු දිනෙක අතැගිලි
රන් කෙන්දෙන් බැදෙයි කියා

**ලුතිතන් එම්එච්ඩීටීඑම් අප්පුහාමි ශ්‍රීලපාහ - මූලස්ථානය 4 ශ්‍රීලපාහ**



# දසුනේ හසුන

පෙළින් පෙළ සැදී එක්ව ගමනක
සුදෝ සුදු මල් යායකි
එහි මුසුව ඇත බොහෝ
මල් නොයෙක් කුලයකි
ඇස රැඳෙන මන බඳින
නුඹ, තඹිලා බාලිකාවකි
තෙවැනි ඇසට මගේ
වනන්නට හැකි නුඹත් කවියකි

පාන මදහස හෙලන බැල්මට
වගෙයි නුඹ අහිංසකි
සිහින් රතැඟිලි නියග අග
මන හැඩ දැමූ ඔපයකි
මුවට ලංව මල් කළඹ
සුවඳ වියදැ සැකයකි
වසන්තය අභියස මේ තවත්
එක් මල් කැකුළකි

**හසුන :**
සෙ/319573 කෝප්‍රල් තරංග ඩීඑම්ඩී - 10 ශ්‍රීලපාහ

**දසුන :**
වයිට් හැකල් ප්‍රකාශන අංශය ශ්‍රීලපාහ

## ප්‍රහේලිකා අංක 56

නිවැරදි විසඳුම්පත් 2013 ඔක්තෝබර් මස 15 වන දිනට පෙර එවිය යුතුය.

තරඟ කූපනය සහ කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.

### වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 56

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | 4 | 5 | 6 | 9 | 2 | | |
| | 7 | | | | | | 3 | |
| 2 | | 5 | | | | 6 | | 4 |
| 8 | | | | | | | | 9 |
| 1 | | | | | | | | 2 |
| 5 | | | | | | | | 6 |
| 6 | | 1 | | | | 9 | | 3 |
| | 2 | | | | | | 6 | |
| | | 9 | 8 | 5 | 6 | 4 | | |

*ප්‍රහේලිකාව ගැන...*

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.
2. කුඩා කොටු නවය තුළ 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර, එය පිළිවෙලකට අවශ්‍ය නොවේ.
3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.
4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙලකට අවශ්‍ය නොවේ.
5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.
6. කුඩා කොටුවක් තුළ හෝ සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

# වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 53

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 7 | 5 | 1 | 6 | 4 | 9 | 3 | 8 | 2 |
| 9 | 8 | 4 | 1 | 2 | 3 | 5 | 7 | 6 |
| 3 | 2 | 6 | 5 | 7 | 8 | 4 | 9 | 1 |
| 2 | 4 | 7 | 3 | 5 | 6 | 8 | 1 | 9 |
| 5 | 9 | 8 | 4 | 1 | 7 | 2 | 6 | 3 |
| 6 | 1 | 3 | 9 | 8 | 2 | 7 | 5 | 4 |
| 4 | 6 | 5 | 8 | 3 | 1 | 9 | 2 | 7 |
| 1 | 3 | 2 | 7 | 9 | 5 | 6 | 4 | 8 |
| 8 | 7 | 9 | 2 | 6 | 4 | 1 | 3 | 5 |

## තරඟ කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගී විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහන හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/-, රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය ලෙස සැලකේ.
5. නිවැරදි පිළිතුරුපත් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගී දීම සිදු කෙරේ.
6. පිළිතුරුපත් එවන ලියුම් කවරේ වම් පස උඩ කෙලවරේ වයිට් හැකල් ප්‍රහේලිකා අංක 56 යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ,
වයිට් හැකල් ප්‍රකාශන අංශය,
රේම ශ්‍රීලපාහ,
යුද්ධ හමුදා ජනපදය,
පනාගොඩ, හෝමාගම.

## මෙවර ජයග්‍රාහකයෝ

ප්‍රථම ස්ථානය

**සෙ/315007 කෝප්‍රල් ප්‍රේමසිරි පීජීඑල්ඩබ්ලිව්**
**රෙජිමූබ ශ්‍රීලපාහ,**
**යුද හමුදා කඳවුර,**
**පනාගොඩ - හෝමාගම.**

දෙවන ස්ථානය

**සෙ/212501 ආසෙ දිසානායක ඊඑම්**
**රෙජිමූබ ශ්‍රීලපාහ,**
**යුද හමුදා කඳවුර,**
**පනාගොඩ - හෝමාගම.**

තුන්වන ස්ථානය

**සෙ/21ඩී00353 සාසෙ කලුආරච්චි ජේකේජේකේ**
**21 (සෙව්) ශ්‍රීලපාහ,**
**යුද හමුදා කඳවුර,**
**ආලන්කුලම් - කුනුක්කායි.**

## වයිට් හැකල් ප්‍රහේලිකාව

**56**

### කූපනය

අංකය : ..............................

නිලය : ..............................

නම : ..............................

රාජකාරී ලිපිනය : ..............................

..............................

..............................

ඒකකය : ..............................

ජාතික හැඳුනුම්පත් අංකය : ..............................

# WAR HEROES MEMORIAL SRI LANKA LIGHT INFANTRY




අප සමග උරෙන් උර ගැටී සටන්බිමේ පෙරමුණ ගෙන ක්‍රියා කර ප්‍රාණදානයෙන් ඇප කැප වූ නිලධාරින් හා සෙබළුන් 3807 දෙනෙකු සදා අනුස්මරණය කිරීම සඳහා රෙජිමේන්තු අධිපතිතුමන් ගේ සංකල්පයකට අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරින් ජ්‍යෙෂ්ඨ සේවා අත්දැකීම් ඇති විශ්‍රාමිකයින් හා සියළුම සෙබළුන්ගේ දිරිමත් කිරීම් හා ශ්‍රම ධන පරිත්‍යාගයෙන් යුතුව ඉදි වන රණවිරු ස්මාරකයේ ඉදි කිරීම් කටයුතු සිදු වන ආකාරය ඡායාරූපවලින් දැක්වේ.













# The Ultimate in Unfair

**Photo by Kevin Carter, a South African photographer who committed suicide in 1994, only a year after taking this Pulitzer Prize-winning photo**

Seeking relief from the sight of masses of people starving to death, he wandered into the open bush. He heard a soft, high-pitched whimpering and saw a tiny girl trying to make her way to the feeding center. As he crouched to photograph her, a vulture landed in view. Careful not to disturb the bird, he positioned himself for the best possible image. He would later say he waited about 20 minutes, hoping the vulture would spread its wings. It did not, and after he took his photographs, he chased the bird away and watched as the little girl resumed her struggle. Afterward he sat under a tree, lit a cigarette, talked to God and cried. "He was depressed afterward. He kept saying he wanted to hug his daughter."

The haunting image made Carter a global celebrity, but it also raised uncomfortable questions about whether he should have helped the girl rather than simply watching her die. To be sure, Carter had plenty of emotional and financial problems, and he drank and used drugs excessively. But's it's not hard to imagine that his world-famous photo left him wracked with guilt, contributing to his suicidal state of mind. In his rambling final note, he wrote, "I am haunted by the vivid memories of killings & corpses & anger & pain of starving or wounded children, of trigger-happy madmen, often police, of killer executioners."



Extract : Internet



## අපි වෙනුවෙන් අපි

ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව



# අපි වෙනුවෙන් අපි රණවිරු නිවාස ව්‍යාපෘතිය

අපි වෙනුවෙන් අපි රණවිරු නිවාස ව්‍යාපෘතිය යටතේ රත්නපුර දිස්ත්‍රික්යේ රණවිරුවන් වෙනුවෙන් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය වෙතින් ඉදි කළ රණවිරු නිවාස 95ක් ප්‍රදානය කිරීමේ උත්සවය 2013.03.02 වන දින සිදු කළහ.

මෙම නිවාස ප්‍රදානය කිරීමේ උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සහභාගි වූ අතර, එම අවස්ථාවට රජයේ මැති ඇමතිවරු රාශියක් හා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය ලේකම් ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ත්‍රිවිධ හමුදාපතිවරු මෙන්ම ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී, රෙජිමේන්තු සේනාවිධායක බ්‍රිගේඩියර් (එවකට කර්නල්) කේජේ ජයවීර ආර්එස්පී ඇතුලු විශාල පිරිසක් සහභාගි වූහ.

රත්නපුර දිස්ත්‍රික්කයේ රණවිරු නිවාස අයිතියට පත් කිරීමේ සංකේතාත්මක නිවස විවෘත කර යතුර අතිගරු ජනාධිපතිපතිතුමන් විසින් 8 ශ්‍රීලපාහ ඒකකයට අයත් ඇහැලියගොඩ, තොරණගොඩ ප්‍රදේශයේ පදිංචි සෙ/3017716 ලාකෝ වීරසේකර ඩබ්ලිව්පීඑස් හට භාරදෙන ලදී. ඇහැලියගොඩ උඩුමත්ත මිහිඳු මහ විද්‍යාලයීය ක්‍රීඩාංගනයේ පැවති උත්සවයේදී ඉතිරි නිවාසයන් හී යතුරු භාරදීම හා බඩුභාහිරාදිය භාරදීම සිදු කරන ලදී.





